# 2014 – 03 – 04 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය :-**

| | | |
|---|---|---|
| 01. | **කමල් වැල්ලගේ මහතා** | ගරු සභාපති (වැ. බ.) |
| **02.** | **ඒ. පී. ලක්ෂමි හේමන්තා සිල්වා මෙනවිය** | ගරු නගර සභා මන්ත්‍රී |
| **03.** | **එච්. එල්. අනුර කිත්සිරි මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| 04. | **පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **05.** | **ග්‍රේෂන් කෙරමිණියගේ මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **06.** | **ඒ. ඩබ්. ජගත් කුමාර මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | **ජේ. ඩබ්. භාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය** | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | **ජේ. ඩබ්. ජයන්ත මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | **ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. 09.45 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.** ☸

## (01)

### 01:01 2014 – 02 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2014 – 02 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2014 – 02 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>සංශෝධන 01</u>**

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන</u>**

2014 – 03 – 04 දින මාසික සභාවේ න්‍යාය පත්‍රයේ දිනය 2014- 03- 04 වන බදාදා දින ලෙස වැරදීමකින් සටහන් වී ඇති අතර එය 2014- 03- 04 වන අඟහරුවාදා දින ලෙස සංශෝධනය විය යුතු බව දන්වා සිටින ලදී.

**(02)** සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන නැත

**(03)** ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

3.1 " පුටු සහ කොඩි කණු ලබා ගැනීම සඳහා " මැයෙන් අම්බලන්ගොඩ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014- 03- 01 දින ඇල්පිටිය පොලිස් අධිකාරීතුමාගේ අර්ධ වාර්ෂික පරීක්ෂණය පැවැත්වෙන බැවින් අදිනට අවශ්‍ය වන කොඩි කණු 27 ක් සහ පුටු 100 ක් මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

**<u>තීරණය</u>**

☞ **2014- 03- 01 දින පැවැත්වෙන අර්ධ වාර්ෂික පරීක්ෂණය සඳහා අවශ්‍ය වන කොඩි කණු 27 ක් සහ පුටු 100 ක් මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභා අනුමැතියට යටත්ව ලබා දී තිබූ අවසරය සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

3.2 " ටී. එච්. ඩබ්ලිව්. නිවාස යෝජනා ක්‍රමයේ ඔප්පු ප්‍රදානය කිරීමට අදාල නිවාස කමිටු පැත්වීම සඳහා කමිටු සාමාජිකයන් නම් කිරීම " මැයෙන් ප්‍රධාන ආදායම් කළමනාකරණ සහකාර මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ටී. එච්. ඩබ්ලිව්. නිවාස යෝජනා ක්‍රමයේ ඔප්පු ප්‍රදානය කිරීමට අදාල නිවාස කමිටු පැවැත්වීම සඳහා කමිටු සාමාජිකයන් නම් කරන ලෙස ඉල්ලා තිබුණි.

**<u>තීරණය</u>**

☞ **කමිටු සාමාජිකයන් ලෙස නගර සභාවේ ගරු සභාපතිතුමා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී දේව් රොහාන් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා, නගර සභාවේ ලේකම්තුමා, ප්‍රධාන කළමනාකරණ සහකාර මහත්මිය සහ ප්‍රධාන ආදායම් කළමනාකරණ සහකාර මහත්මිය පත් කිරීමට සභාව තීරණය කරන ලදී .**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ **නැත**

**(05)** යථා පරිදි කල්දී ඇති යෝජනා

**5:1** **ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා** නැත

**5:2** **නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා** : නැත

**(06)** කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2014- 02- 17** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මුලාසනය දැරූ 2014/02/17 දින</u>**
**<u>පුස්තකාල කමිටු වාර්තාව.</u>**

| | |
|---|---|
| ■ එච්.එල්. අනුර කිත්සිරි මහතා | (ගරු නගර සභා මන්ත්‍රී) |
| ■ ජේ.ඩබ්. භාෂිනි මේනුකා විජේසූරිය මිය | (ගරු නගර සභා මන්ත්‍රීනි) |
| ■ ශාන්ති ඩී. රාමනායක මිය | (ප්‍රධාන කළමනාකරණ සහකාර) |
| ■ ඩී.වී. වාසනා තරංගී මිය | (ප්‍රජා සංවර්ධන නිලධාරී) |
| ■ ටී. නදීකා නිල්මිණි මෙනවිය | (සංවර්ධන නිලධාරී) |
| ■ කේ.ඩබ්. රංජනි මානෙල් මෙනවිය | (පුස්තකාලයාධිපතිනි) |
| ■ ජී.ඩබ්. ගුණසිරි මහතා | (කමිටු සාමාජික) |
| ■ හර්බට් වීරක්කොඩි මහතා | (කමිටු සාමාජික) |
| ■ සුගත් හෙට්ටිආරච්චි මහතා | (කමිටු සාමාජික) |
| ■ ජී.එච්.එල්. පියන්ති මෙනවිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ඒ.ඩබ්. ඉන්දදාස මහතා | (පුස්තකාල සාහායක) |
| ■ ගෞරි වර්සවිතාන මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ඒ.ජී. රසිකා මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ එස්.එම්. මනෝරි චන්ද්‍රවංශ මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ කේ.ඒ. විසුද්ධි රේණුකා මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ මාලතී සමන්තා ආරියසිංහ මිය | (පුස්තකාල සාහායිකා) |

■ එම්.ඩබ්. ජීනේකා සුමංගලී මිය (පුස්තකාල සාහායිකා)

■ ඒ.පී. ලක්ෂ්මී පෙරේරා මෙනවිය (පුස්තකාල සාහායිකා)

ගරු සභාපතිතුමා කමිටුවට පැමිණි මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් පසු එදින ප.ව 2.30 ට කමිටුවේ වැඩ ආරම්භ කළාය.

■ **පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම පළමුව සිදුවිය.**

ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින් ද, අනෙකුත් ශාඛා පුස්තකාලවල ප්‍රගති වාර්තා ඒ ඒ ශාඛා භාර නිලධාරීන් විසින් ද, ඉදිරිපත් කරන ලදී. විද්‍යුත් පුස්තකාලයේ වාර්තාව සංවර්ධන නිලධාරි ටී. නදීකා නිල්මිණි මෙනවිය විසින් ඉදිරිපත් කරන ලදී.

පුස්තකාල කමිටු රැස්වීම සඳහා සහභාගි වීමට නොහැකිබව දන්වා සිරිපාල මාදුවගේ මහතා විසින් එවන ලද ලිපිය කමිටුවට ගරු සභාපතිතුමා ඉදිරිපත් කළේය. කමිටු සාමාජික හර්බට් වීරක්කොඩි මහතා කියා සිටියේ පෞද්ගලික අවශ්‍යතාවයක් නිසා ටී.ඩබ්. පියසිරි මහතා හා ටී.ඩබ්. හරිස්චන්ද යන කමිටු සාමාජික මහතුන් දෙදෙනාට ද කමිටුවට සහභාගීවීමට නොහැකි බව දැන්වූ බවයි.

__අදහස් හා යෝජනාः-__

■ 2013 සමීක්ෂණ වාර්තා අනුව ප්‍රධාන පුස්තකාලයේ හා ශාඛා පුස්තකාලවල පොත් සමීක්ෂණ වාර්තා ගරු සභාපතිතුමා විසින් නිරීක්ෂනය කරන ලදී. මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ පොත් අඩුවීම ගැන ගරු සභාපතිතුමා කරුණු විමසුවේය. එහිදී ප්‍රධාන කළමනාකාර සහකාරතුමිය හා පුස්තකාල සාහායිකා මනෝරි මහත්මිය කියා සිටියේ දෙමහල් ගොඩනැගිල්ලක් බැවින් පොත් සඳහා ආරක්ෂිත කබඩ් නොමැති බවයි. පසුගිය සමීක්ෂණයේ දී කබඩ් ඉල්ලා ඇතත් එය නොලැබුණු බවද ඔවුහු කීහ. ළමයින් ඉහළ මාලයේ පොත් නිතර පරිහරණය කරන බවද කමිටු සාමාජික හර්බට් වීරක්කොඩි මහතා විසින් පෙන්වා දෙන ලදී. මෙහිදි හර්බට් වීරක්කොඩි මහතා ඊට විසඳුමක් ලෙස ඉහළ මාලයට යන ළමයින්ගේ පොත් එම සාහායිකාවට පොතක සටහන් කොට ආපසු යන විට එම පොත් පරීක්ෂා කිරීම සුදුසු බව කීවේය. රුපියල් 3000/- මුදලක් එම සාහායිකාවට පොත් සඳහා ගෙවීමට සිදුවන බැවින් මාස කිහිපයකින් එම මුදල අයකර ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට ගරු සභාපතිතුමා උපදෙස් දුන්නේය. මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයට පොත් ආරාක්ෂා කර ගැනීම සඳහා කබඩ් හැකි ඉක්මනට ලබාදීමට කටයුතු කරන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරිතුමීයට කීවේය. එහිදි හෙප්පුමුල්ල ශාඛාවේ සේවය කරන ගෞරි මහත්මිය එවැනි කබඩ් එකක් එම ශාඛාවටත් අවශ්‍ය බව පැවසීය. ගරු සභපතිතුමා හැකි ඉක්මනින් කබඩ් ලබාදීම සුදුසු බව තීරණය කළේය.

■ පසුගිය කමිටුවේ සඳහන් පරිදි ප්‍රධාන පුස්තකාලයේ කාණු තුළ ආපන ශාලාවෙන් ඉවත්වන අපවිත්‍ර ජලය බැස්ස වීමට කාණු පිළිසකර කර දෙන ලෙසද වළක් කපා අපවිත්‍ර ද්‍රව්‍ය ඒ තුළට දැමීමට ක්‍රියාකළයුතු බැව්ද පෙන්වා දුන්නේය. මේ දක්වා එයට ක්‍රියාමාර්ගයක් නොගැනීම නිසා මෙවැනි කමිටු රැස්වීම් වලින් සේවයක් ලබා නොගැනීම ගැන කණගාටු බව ගරු සභාපතිතුමා පැවසුහ. අදාල නිලධාරීන් දැනුවත් කොට එය සභාවට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා පැවසීය. ගියවර කමිටුවේදී ගත් තීරණ හා එයට පිළියම් දෙවැනි කමිටු රැස්වීමට ප්‍රථම අවසන් කළ යුතු බවද තව දුරටත් කරුණු දැක්වීය. කමිටුවේ යෝජනා ක්‍රියාත්මක නොවේනම් කමිටුවක් අවශ්‍ය නැතිබවද ගරු සභාපතිතුමා පැවසීය.

■ මේ අවස්ථාවේදි කමිටු සාමාජික සුගත් හෙට්ටිආරච්චි මහතා පුවත්පත් කියවන ස්ථානයේ විදුලි පංකාව ක්‍රියාවිරහිතවීම ගැන පැවසීය. පාඨක අදහස් පොතේ පසුගිය කාලය තුළ එම ස්ථානයට විදුලි පංකාවක් අවශ්‍ය නැතිබව සටහන් කර ඇතිබැවි පෙන්වා දුන්නේය.

■ ගරු නාගරික මන්ත්‍රී අනුර කිත්සිරි මහතා කියා සිටියේ ශාඛා පුස්තකාල තිබෙන ප්‍රදේශවල වයෝවෘද්ධ පුද්ගලයන්ට පාරේ කනුවල විදුලි බල්බ ක්‍රියාවිරහිත වූ විට නගර සභාවට පැමිණීමට අපහසු බවයි. එයට විසදුමක් ලෙස ශාඛා පුස්තකාල තුළ පොතක් ලබා දී එම කනුවේ අංකය, පාර සඳහන් කිරීම සඳහා එම ශාඛාභාර නිලධාරින්ට එම පුද්ගලයින්ට පහසුකම් ලබාදෙන ලෙස කීවේය. මේ පොත දැමීමෙන් පසු විදුලි කාර්මික ශිල්පීන් එම ශාඛා පුස්තකාලවල සතියකට වරක් බැලීමෙන් එම අවශ්‍යතාවය සපුරන ලෙස ප්‍රකාශ කළේය. මෙයට ගරු සභාපතිතුමා ඇතුළු කමිටු සාමාජික මහත්වරු කැමැත්ත ප්‍රකාශ කළහ.

■ වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින් ස්තුති කතාව සඳහා නාගරික මන්ත්‍රී අනුර කිත්සිරි මහතාට ගරු සභාපතිතුමා ආරාධනා කළේය. එහිදී එතුමා ස්වේඡාවෙන් කමිටුවට පැමිණි සභාපතිතුමා, කමිටු සාමාජික මහතුන් ඇතුළු පුස්තකාලයාධිපතිනිය හා කාර්ය මණ්ඩලයට ස්තුතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කළේය.

**ඒ අනුව 2014 -02- 17 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2014- 02- 20** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. භාෂිනි මේනුකා විජේසූරිය මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සභාව**

**කළමනාකරණ කමිටු වාර්තාව**

| | | |
|---|---|---|
| **දිනය** | : | **2014.02.20** |
| **ස්ථානය** | : | **නගර සභාව, අම්බලන්ගොඩ** |
| **වේලාව** | : | **පෙ.ව. 10.00** |
| **සහභාගීත්වය** | : | **භාරත සමරසේකර මයා - ලේකම්** |
| | | **ඩී. ඩබ්. පත්මසිරි මයා - ගණකාධිකාරී** |
| | | **එම්. ඩබ්. සිසිර කුමාර මයා - කර්මාන් අධිකාරි** |
| | | **ශාන්ති ඩී. රාමනායක මිය - ප්‍රධාන කළමනාකරණ සහකාර** |
| | | **නිර්මලා ද සිල්වා මිය - ප්‍රධාන කළමනාකරණ සහකාර ආදායම්** |
| | | **කේ. සී. සී. ප්‍රනාන්දු මිය - අභ්‍යන්තර විගණන නිලධාරි** |
| | | **වාසනා තරංගි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරි** |
| | | **මානෙල් රංජනි මෙය - පුස්තකාලයාධිපති** |
| | | **පී.එම් ටී විමලධර්ම මෙය - සංවර්ධන නිළධාරි** |

01. **පිළිගැනීම.**

❖ සියලුම දෙනාටම සුභ උදෑසනක්, හැම දෙනාම කළමනාකරණ කමිටුවට සාදරයෙන් පිළිගන්නවා. **- ලේකම්**

**ආයතන අංශය පිළිබඳව සාකච්ඡා කිරීම**

❖ කාර්ය සාධනයට අවශ්‍ය කටයුතු කරගෙන යන බවත් රියදුරන්ගේ පෞද්ගලික ලිපි ගොනු සකස් කර අවසන් එම ලිපි ගොනු පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට යැවීමට තිබෙන බව හා කර්මාන්ත හා සෞඛ්‍ය අංශවල අන්තර්ග්‍රහනය කර අවසන් කර බව

**- ප්‍රධාන කළ: සහකාර**

❖ විෂය ගොනු ලේඛන සියලු දෙනා ලඟ තිබෙද? **- ලේකම්**

❖ සියලුම ලිපි ගොනු සකස් කර අවසන් සැම දෙනා ලගම තමා සතු ලිපි ගොනු වල ලේඛනයක් පවතින බව ප්‍රකාශ කරන ලදී.

**- සියලුම අංශ ප්‍රධානීන්**

**ගිණුම අංශය පිළිබඳව සාකච්ඡා කිරීම**

❖ 2013 අවුරුද්ද සඳහා අවසන් ගිණුම් සාදා විගණන දෙපාර්තුමේන්තුවට 2014.03.31 ට පෙර යැවිය යුතුයි. සැම අංශයක් සඳහාම ලිපියක් මගින් 2014.01.08 වන දින දැනුම් දුන්නා, සියලුම වාර්තා 2014.01.21 වන දිනට පෙර ලබා දිය යුතු බව එහෙත් සමහරක් අංශ තවමත් මෙම වාර්තා ලබා දී නොමැත. එනම් එම අංශ

1. 2013.12.31 - වෙළඳ බලපත්‍ර උප ලේඛනය
2. 2013.12.31 - ප්‍රචාරක ගාස්තු හිග ශේෂය හා ඊට අදාළ උප ලේඛනය
3. 2013.12.31 - නිවාස කුලි උප ලේඛනය
4. 2013.13.31 - විනෝද බදු හිග ශේෂය

වහම මෙම අංශ වල ගිණුම් මේ සතිය ඇතුලත ලැබෙන්න සලස්වන්න. **-ගණකාධිකාරී**

❖ වෙළඳ බලපත්‍ර උප ලේඛන නිවැරදිව තිබිය යුතුයි. විගණන විමසුම් පරික්ෂාකරන විට වෙළඳ බලපත්‍ර උප ලේඛන වලට ප්‍රමුඛත්වය ලබා දීම නිසා. **- අභ්‍යන්තර විගණන නිලධාරී**

❖ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් එවන ලද ලිපියක් සාකච්චා කරන ලදී .එම ලිපියේ අඩංගු කරුණු වලට පිළිතුරු වශයෙන් පහත කාරනා යොජනා විය. එම ලිපිය අමුණා ඇත.

I. කරුණ සඳහා - සභාව විසින් අනුමත කරන ලද රු 5000 න් රු 3000 ක් කාර්යාලය සඳහාද 1000 ක් පුස්තකාලය සඳහාද 1000 ක් අයුර්වේද මධ්‍යස්ථාන සඳහා තේ වලට වෙන් කර තිබේ. මෙය කාර්යාල නිලධාරීන්ගෙ ඉල්ලීමක් නොව සභා තිරනයක් විය. මෙම මුදලෙන්ම කාර්යාලයට එන විශේෂ අමුත්තන්ට සංග්‍රහ කිරීමත් සිදුවේ. මෙම ප්‍රශ්නයට පිළිතුරක් ලෙස කාර්යාලයේ පෙර පරිදිම නිළධාරීන්ගෙන් මුදල් එකතු කර තේ බිමට යෝජනා විය.

II. කරුණ සඳහා - පිළිතුරු යැවීමට වාර්ථාවක් සකස් කිරීමට චාන්දනි මියට යෝමු කරන ලදී. එහිදී බංගලාදේශ සංචාරකයින්ගේ පැමිනීම ක්ෂණිකව සිදුවූ බවත් එහිදී හැකිතාක් දුරට ක්ෂණික තිරන ගැනීමට සිදුවූ බව පිළිබඳව වාර්ථා කරන්න

III. කරුණ සඳහා - මුද්දර පරික්ෂන සඳහා නිලධාරින්ට ලබා දෙන අත්තිකාරම් මුදල රු 2500 ට අඩු කරන ලෙස දැණුම් දෙන ලදී.

IV. කරුණ සඳහා - බොයිලේරුව අලුත් වැඩියාවක් නොකර බවත් අලුතින්ම බොයිලෙරුවක් අප ආයතනයේ නිශාන්ත මයා හා බුද්ධික මයා විසින් නිශ්පාදනය කළ බවත්, අලුතින්ම බොයිලෙරුවක් මිල දී ගැනිමේදී ලක්ෂ 6කට අධික මුදලක් වැයවන බවත් නමුත් මෙය නිෂ්පාදනය කිරීමට වැය වුයේ රු 20000 ක් වැනි මුදලක් නිසා මෙයින් නගර සභාවට ඉතා විශාල මුදලක් ඉතුරු කරදීමට හැකි වු බවත් අප නිලධාරින්ගේ හැකියාව පිළිබඳව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුනු කිරීමෙ අධිකාරියේ නිලධාරීන් විසින් අගය කිරීමකට ද ලක් කරන ලදී.

මෙම ලිපියට පිළිතුරක් ලෙස වාර්ථාවක් සකස් කර එය සභාවට යොමු කරන ලෙස චාන්දනි මියට පවරන ලදී. මෙම ලිපියේ කරුණු පිළිබඳව සැහිමකට පත්විය නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

❖ ගණකාධිකාරිතුමා විසින් කළමණාකරන කමිටු වාර්තාවට යොමු කිරීම සඳහා ලිපියක් ලබා දෙන ලදී. එය මෙසේය,

සභාපතිතුමා,

1. පොදු ගිණුමේ 2014.01.240 දිනට ශේෂය - 351541.72

2. පොදු ගිණුමේන් ගෙවිය යුතු අත්‍යාවශ්‍ය ගෙවීම්,

I. ජාතික ජල.සම්.ම. ජල බිල් 2013 නොවැ. - 62296.94

II. සී/ස ලංකා විදුලි LECC -එම- - 161484.57

III. සී/ස වි.ස්.ස.ස. ඉන්ධන

a) 2013 ඔක් 15 - 31 - 96618.60
b) 2013 නොවැ 1 - 15 - 160432.90
c) 2013 නොවැ 15 - 30 - 136570.00
d) 2013 දෙසැ 1 - 15 - 115300.00
e) 2013 දෙසැ 15 - 31 - 130062.80

638984.90

IV. 2014 ජන 10 දින ගෙවීමට නියමිතව තිබු අතිකාල හා දිමනා I -IV දක්වා එකතුව - } 127239.93

638984.90

I -IV දක්වා එකතුව 990006.34

පොදු ගිණුමේ 2014.01.24 දින ශේෂය වු රු 351541.72 මුදල භාවිතා කර 2014ග01ග27 ඉහත ගෙවීම් වලින්

I. - 62296.94
II. - 161484.57
III. - 96618.60

320400.11 ක් ගෙවමට සැලසුම් කර තිබුණි. එසේ තිබියදී සභාපති තමා රු 156576/= ක කර්මාන්ත ගෙවීමක් කරන ලෙස උපදෙස් ලබා දී ඇත.

3. 2014.01.24 දිනට තැම්පත් ගිණුමේ ශේෂය රු 134371.72 2013 තැම්පත් කිරීමෙන් ගෙවා ඇති ඉන්ධන බිල්පත්
4.

1. 2013.03.27 - 227017.10
2. 2013.04.26 - 309398.50

536415.60 කි

නව අයිස් කර්මාන්ත ශාලාව සඳහා විදුලිය ලබා ගැනීමට භූගත කේබලයක් එලිමට පාර පළුදු කිරීම වෙනුවෙන් තැන්පත් කරන ලද රු 300,000/= ගෙවීමට අනුමැතිය ලැබී වවුචර ඉදිරිපත් කර ඇතත් තැන්පතු මුදල බේරුම් කිරීමට නොහැකිව රැදී පවතී. එම චෙක්පත ලබා ගැනීමට 2014.01.24 දින පැමිණි අතර අද දිනද පැමිණෙන බව මා වෙත වාචිකව දන්වන ලදි. එම මුදල පොදු ගිණුමෙන් හෝ ගෙවා බේරුම් කල යුතුයි.

5. නගර අලංකාර ගිණුමේ ශේෂය 2014.01.24 දිනට රු 312865.64 කි.

6. ගල් සැපයීම වෙනුවෙන් ගෙවිය යුතු රු 59600/= ක වවුචරයට වවුචරයට ගෙවීම් කරන ලෙස ඉල්ලීම් කර ඇත. ඊට අදාල ලිපියක් යා කර ඇත.

ඉහත කරුණු කෙරේ අවදානය යොමු කර සුදුසු කටයුතු සඳහා ලිපි ඉදිරිපත් කරමි.

ලේකම්/නස/2/11

ඉහත නියෝගය පරිදි පොදු ගිණුමේන් කර්මාන්ත ගෙවීම් කරන්න මෙම නියෝගය අනුව කටයුතු කිරීම හේතුවෙන් අත්‍යාවශ්‍ය ගෙවීම් ප්‍රමාද වීමෙන් ඉදිරියේදී ගැටලු මතුවනු ඇත.

❖ පෙර දින එනම් 2014.02.19 වන දින සාකච්චා කළ පරිදි පරිගනක පැකේජය මෙම මාසය තුලදී සාර්ථකව ලබා ගැනීම සඳහා අප ආයතනය මගින් ඉටුවිය යුතු අඩු පාඩු අවම කර ගැනීමට කටයුතු කළ යුතු බවත්, වයඹ සංවර්ධන අධිකාරිය මගින් සිදුවන අඩුපාඩු නිවැරදි කර ගන්නා ලෙස කටයුතු කිරීමට වගබලාගත යුතුය. මෙම පරිගනක පැකේජය මේ අවුරුද්දේ භාවිතා කිරීමට යෝජනා කරද මෙවන තෙක් සාර්ථකව භාවිතා කිරීමට නොහැකි වී ඇත. මෙම තත්වය යටතේ මේ අවුරුද්ද තුල පුහුනු කාලයක් ලෙස භාවිතා කරමින් ලබන අවුරුද්දේ සිට මෙම පරිගනක පැකේජය සාර්ථකව භාවිතා කරමු.

❖ පරිගනකවල සුළු සුළු අඩුපාඩුකම් පවතින විට එම අඩුපාඩු සකස් කර ගැනිම සඳහා අප ආයතනයේම නිලධාරින් වන නලින් මයා හා නිලන්ති මිය ඒ සඳසා යොදා ගන්න. ඔවුනුට පරිගනක අලුත් වැඩියා කිරිම පිලිබද පුහුණුවක් ලබා දී තිබේ. අප ආයතනයේ නිලධාරින් සතුව පරිගනක පිළිබද යම් යම් දුර්වලතා දැක ගැනිමට හැක. මෙම තත්වයට විසදුමක් ලෙස ගාල්ලේ කාර්මික විද්‍යාලයෙන් කතිකාචාර්යවරයකු ගෙන්වා අප නිලධාරින්ට දැනුම ලබා දීමට කටයුතු කරන්න. -
**ගණකාධිකාරි**

- **තිරණය**

ගාල්ලේ කාර්මික විද්‍යාලයෙන් කතිකාචාර්යවරයකු ගෙන්වා අප නිලධාරින්ට දැනුම ලබා දිමෙ වැඩසටහන ක්‍රියාත්මක කිරිම හා ඒ සඳහා මුදල් ගෙවිමක් කිරිමවද සිදුවනු ඇත. මෙය ක්‍රියාත්මක කිරිමට කටයුතු කිරිමට යෝජනා විය.

**ආදායම් අංශය පිළිබදව සාකච්ජා කිරිම**

❖ අප අංශයට ඉල්ලු කැබිනට් එක ලැබුණු බවත්, හිග වරිපනම් ලක්ෂ 90කට වඩා පවතින බවත් මෙම වරිපනම් එකතු කිරිමට යාමට ජන්දයෙන් පසු සභාපතිතුමාගේ සහය ලබා දෙන බව ප්‍රකාශ කර ඇත. තවද සිතාර මයාට වරිපනම් එකතු කිරිමට යාම සඳහා ලිපියක් මගින් දැනුම් දිමක් සිදුකරන ලෙස ඉල්ලා ඇත.

**-ප්‍රධන කළ: සහකාර ආදායම්**

❖ පළාත් පාලන ආයතනවල ආදායම් ප්‍රවර්ධනය පිළිබද සාකච්චාවේදී අප ආයතනය විසින් ඉදිරිපත් කළ යොජනා මෙසේය.

I. පසුගිය අවුරුදුවල ලැබිමට තිබෙන හිග වරිපනම් මෙසේය

- 2010.12.31 - රු 9403721
- 2011.12.31 - රු 9159859
- 2012.12.31 - රු 9311660
- 2013.12.31 - රු 9852753 මෙපමණ මුදලක් හිග වරිපනම් ලෙස ලැබිමට ඇති බවත් එම මුදල් අය කරගැනිම සඳහා නඩු පැවරිය හැකි පරිදි නීති සංශෝධනය කිරිම.
-

II. නගර සභා අඥා පනතේ 165 ඈ (1) යටතේ සංවර්ධනය කළ නොකල ඉඩම් වලින් බදු අය කිරිම.

III. අම්බලන්ගොඩ බල ප්‍රදේශයේ දැනට ඇති සියලු වාණිජ බැංකු සමග සම්බන්ද වි නගර සභා පොදු ස්ථාන වල ස්වයංක්‍රිය ටේලර් යන්ත්‍ර (ATM) බදු කුලි පදනම යටතේ ස්ථාන ගත කිරිමට කටයුතු කිරිම.

IV. කොම්පොස්ට් ව්‍යාපෘතිය කඩිනමින් කිරිම

V. ක්‍රීඩා භූමි නඩත්තු කිරිම හා ක්‍රීඩා උපකරන මිල දී ගැනීමට අනුග්‍රහක පහසුකම් සලස්වන ආයතන හා පුද්ගලයින් සම්බන්ද කර ගැනිම.

VI. නගර සභා බල ප්‍රදේශයේ දේපල තක්සේරු වටිනාකම් යාවත්කාලින කිරිම.

VII. නගර සභා අරමුදලින් වැය කිරිමේදි වඩාත් පිරිමැසුම්දායිව වැය කිරිම. **-ගණකාධිකාරි**

**කර්මාන්ත අංශය පිළිබදව සාකච්ජා කිරිම**

❖ කර්මාන්ත අංශයේ කටයුතු සමාන්‍ය පරිදි කරගෙන යන බවත්, මහජන පැමිනිලි පොතක් පවත්වාගෙන යන බවත්, ප්‍රකාශ කරණ ලදී

**-කර්මාන් අධිකාරි**

- **තිරණය**

කර්මාන්ත හා සෞඛ්‍ය යන අංශ දෙක සඳහා වැටුප් ගෙවන දවසටම අතිකාල දිමනා හා වෙනත් සියලුම දිමනා ගෙවිම සිදුකර යුතු බවත්, වැටුප් සකස් කරන දිනට පෙර දිනයක් ලබා දි එදිනට පෙර අතිකාල දිමනා හා වෙනත් සියලුම දිමනා ලබා දිය යුතු බවට දැනුම් දෙන ලෙස තිරණය විය.

**පුස්තකාල අංශය පිළිබදව සාකච්ජා කිරිම**

❖ සියලුම පොත් බැද අවසන් බවත්, එම පොත් කැපිමට අවශ්‍ය බවත් පොත් කැපිමට උපකරනයක් නොමැත මෙ සඳහා මුදලක් අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී. **-පුස්තකාලයාධිපති**

❖ පොත් කැපිමට ගන්නා උපකරනය වැඩි මිලක් නොවන බැවින් එම උපකරනයක් මිල දී ගැනිමට කටයුතු කරන්න.

**-අභ්‍යන්තර විගණන නිලධාරි**

**02. රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරිම.**

❖ ස්තුති කථාව කිරීම සහ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම. - ප්‍රධාන කළ: සහකාර

සකස් කළේ :පී.එම් ටී විමලධර්ම (සංවර්ධන සහකාර)

පෙ. ව. 10.00 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.

ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්

සභාපතිතුමනි මෙම වාර්තාව දිහා බලන කොට නගර සභාවෙ මූල්‍ය අර්බුදයක් තියෙන බව පේනවා. මට මේ ලඟදි විදුලි සමාගමේ සේවකයෙක් කිව්ව නගර සභාවෙ ලයිට් කපන්න ආව කියලා. මම කියනවා නගර සභාවෙ කීර්තිනාමය නැති කරන්න එපා කියලා. විශේෂයෙන් මේ කාර්යභාරය පැවරෙන්නෙ ලේකම් මහත්තයටයි ගණකාධිකාරී මහත්තයටයි. අද වෙනකොට චෙක්පත් අත්සන් කිරීමේ බලය සභාපතිවරයාගෙන් අයින් කරල ලේකම්වරයටයි ගණකාධිකාරීවරයටයි දීල තියෙනවා. මට නගර සභාවෙ ආදායම් වියදම් ගැන අමුතුවෙන් කියන්න ඕනෙ නැහැ. මම 1983 ඉඳල ඒ ගැන හොඳට දන්නවා. අපි එදා නගර සභාවෙ මුදල් තත්වය හොඳනැති වුනහම අපි කිව්වෙ අපිට ජ්ලේන්ටියක් බිව්වම ඇති කියලා. පණ්ඩුල ජයසූරිය මහත්තය විපක්ෂයෙන් යෝජනා කරා අපි වියදම් අඩු කර ගන්න ලිපි එවන ඒව එක කවරයක දාල එවමු කියලා. අපි ඒ විදියට තමයි එදා මේක ආරම්භ කරගෙන ආවෙ. මම කියන්නෙ නැහැ එදා වියදම් කරපු මුදලට අද කරන්න කියල. නමුත් මම ඔබතුමාලට කියනවා අරපිරිමැසිමෙන් වියදම් කරන්න කියලා. අයිස් කර්මාන්ත ශාලාවෙන් ලක්ෂ තුනක ඇප මුදලක් තැන්පත් කරල තියනවා. ඒ මහත්මයට 24 වෙනිදා එන්න කියල තියෙනව ඒක ගෙවන්න. නමුත් ගෙවා ගන්න බැරිවෙලා තියෙනවා. ආයෙ දවසක එන්න කියලා. තැන්පත් මුදල් වෙනම ගිණුමක තැන්පත් වෙන්න ඕනෙ. ඇත්තවශයෙන්ම මේ කළමනාකරණ කමිටු වාර්තාව මන්ත්‍රීවරු කියවන්න ඕනෙ. මේක ඉතාම වැදගත්. ඉන්ධන ගෙවීම් තියෙනවා, ගල් සැපයුම සඳහා ගෙවීම් තියෙනවා.

ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

මන්ත්‍රීතුමා අද වෙනකොට මේ ගෙවීම් කරල තියෙන්නෙ. එදා දිනේට තිබුනට. තමුන්නාන්සේ දිගින් දිගටම වැරදි පෙන්වන එක වැරදියි. තමුන්නාන්සේලාගෙ බාලෙත් මේව තිබුන. 1997 අපි මේක භාර ගන්න කොට එක්කෝටි ගානක් හිග තිබුනා.

ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්

මම මේ කතා කරන්නෙ පහුගිය මාසෙ තිබුන කළමනාකරණ කමිටු වාර්තාව සම්බන්ධව. අපි මේව පෙන්වල දෙන්න ඕනෙ. මම කියන්නෙ ගිණුම් නිසි ආකාරව පවත්වාගෙන යන්න කියලයි. මම තමුන්නාන්සේගෙන් අහනව ලක්ෂ දහ අටක පොත් ගත්ත. ඒක ගෙවලද කියලා.

ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්
ඒක තාම ගෙවල නැහැ.

ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්
ඒක ගෙවලනම් අපිට මෙතන අඩු වෙලාද කියල දැන ගන්න පුලුවන්. ඒකයි මට දැනගන්න ඕනෙ. තමුන්නාන්සේගෙන් මම ඉල්ලා සිටිනවා මුදල් සම්බන්ධ පරිපාලන කටයුතු නිසි ලෙස කරන්න කියා ඉල්ලා සිටිනවා.

ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

ඔබතුමාගෙ ඒ අවවාදය මම පිළිගන්නව. ඒවගේම නගර සභාව බංකොලොත් භාවයට පත් කරන්න කාටවත් අපි ඉඩ දෙන්නෙ නැහැ. ඒකත් කියන්න ඕනෙ. ලයිට් කපන්න ආව කතා අපි දන්නෙත් නැහැ. තමුන්නාන්සෙ කවුරු හරි කියපු කතාවක් මෙතන කියනවා. ඒවගේම මෙතන මිනිස්සු ආවම රස්තියාදු කරන්නෙ නැහැ. මම නිලධාරීන්ට පවා දොස් කියන අවස්ථා තියෙනවා. අපි ඉන්නෙ ඒකට තමයි. අපි මෙතන අම්බලන්ගොඩ ජනතාව අපහසුතාවයට පත් කරන්නෙ නැහැ. තමුන්නාන්සෙ මෙතන ලයිට් කපන්න ආවයි කියල සභාවෙ කියනවා. මෙතන අදාල නිලධාරියා ඉන්නවා. ලේකම් තුමා ඉන්නවා. එහෙම දෙයක් වෙලා නැහැ.

**ඒ අනුව 2014 -02- 20 දින පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3** **2014- 02- 20** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව**
**2014.02.20 ප.ව. 2.30**

**සහභාගීත්වය**

- ඩබ් කමල් ද සිල්වා මහතා. — ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
- භාෂිනී විජේසූරිය මහත්මිය. — ගරු නගර සභා මන්ත්‍රීනී අම්බලන්ගොඩ නගර සභාව
- භාරත සමරසේකර මමතා. — ලේකම් අම්බලන්ගොඩ නගර සභාව
- එස්, ඩී, රාමනායක මහත්මිය. — ප්‍රධාන කළ, සහකාර අම්බලන්ගොඩ නගර සභාව
- එම්.එච් නිහාල් රණසූරිය මහතා. — පරිපාලක ම. සෞ. පරීක්‍ෂක, සෞ.වෛ.නි. කාර්යාලය
- පී. එස්. එස්. ද සිල්වා මහතා. — ම. සෞ. පරීක්‍ෂක, අම්බලන්ගොඩ නගර සභාව
- එච්. නයනා චාන්දනි මහත්මිය. — සංවර්ධන සම්බන්ධීකාරක ප්‍රා.ලේ. අම්බලන්ගොඩ.
- පී. එච්. එල්. සී. පුෂ්පරාණි මහත්මිය. — සං සහකාර, අම්බලන්ගොඩ නගර සභාව,
- පී. කුසුම් ද සිල්වා මහත්මිය. — කළමණාකරණ සහකාර
- එම්.ඩබ්.එච්.එස්.චිත්‍රාවංශ මහතා — සෞඛ්‍ය පරිපාලක
- එම් එච් පද්මසේන මහතා. — සෞඛ්‍ය පරිපාලක

**පිළිගැනීම :-**

**අම්බලන්ගොඩ නගර සභාවේ වත්මන් සභාපති ඩබ් කමල් ද සිල්වා මහතා,**
සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටුව සඳහා පැමිණි මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් ඇතුළු සියලුම රජයේ නිලධාරි මහත්ම මහත්මීන් නගර සභා ලේකම් මහතා ඇතුළු කාර්‍ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි. ඉන් අනතුරුව එළඹියේ පසුගිය රැස්වීමේ සාකච්ඡා වූ කරුණු සමාලෝචනයක යෙදීමයි.

**ගර්භණී මව්වරුන් සඳහා චීත්ත රෙදි ලබා දිම හා පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

**තීරණය.**
බලාපොරොත්තුවන ප්‍රසව දිනය ඇතුළත් ගර්භණී මව්වරුන්ගේ ලැයිස්තුව ලැබුණු බවත් ඉදිරියේදී සෞ.වෛ.නිලධාරී තුමිය සමග සාකච්ඡා කර චීත්ත රෙදි ලබා දීමට තීරණය කරන ලදි.

**සෞඛ්‍ය වෛද්‍ය සායනය පිළිබඳ සාකච්ඡා කිරීම.**

**ම. සෞ. පරීක්ෂක,** එම්.එච් නිහාල් රණසූරිය **මහතා.**

**2014** ජනවාරි 28 දින සායනය පැවැත්වීම සඳහා සියළු කටයුතු සංවිධානය කර ගත්තද එදින විදුලිය විසන්ධි කරන බව විදුලි බල මණ්ඩලයෙන් දැනුම් දුන් නිසාත්, ග්‍රාම නිලධාරීන් සඳහා 28 දින රැස්වීමක් පැවැත්වෙන බැවිනුත් සායනය අවලංගු කිරීමට සිදු වූ බවත් ඒ සඳහා ඉදිරියේ දි දිනයක් ලබා ගන්නා බවත් පවසන ලදි.

**තල්ගස්ගොඩ ප්‍රදේශයේ අයාලේ යන සුනඛයන් සම්බන්ධ ගැටළුව වර්තමාන තත්වය**

**ම. සෞ. පරීක්ෂක,** එම්.එච් නිහාල් රණසූරිය **මහතා.**

මාර්තු 01 දින සිට සතියක් ඇතුළත මධ්‍යස්ථාන කිහිපයකදී සුනඛ එන්නත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන බවත් පවසන ලදි

**සෞඛ්‍ය පරිපාලක එම්.ඩබ්.එච්.එස්.චිත්‍රාවංශ මහතා.**

බස් නැවතුම්පොල පොදුවෙළඳ සංකීර්ණයේ වැසිකිළිය අනිසි ලෙස භාවිතා වන බැවින් මේ සඳහා ටෙන්ඩර් කරන ලෙස පවසන ලදි.

**අම්බලන්ගොඩ නගර සභාවේ වත්මන් ගරු සභාපති ඩබ් කමල් ද සිල්වා මහතා.**

වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා අවශ්‍ය පහසුකම් අප විසින් සැපයිය යුතු බැවින් වැසිකිළිය ටෙන්ඩර් කිරීම එතරම් සුදුසු කටයුත්තක් නොවන බවත් එහි ජලය අනිසි ලෙස භාවිතා වන අයුරු තමා සියැසින් දුටු බවත් මෙයට විසදුමක් වශයෙන් අපතේ යන ජලය පාලනය කිරීම සඳහා ජල පාලන කරාමයක් යෙදීම සුදුසු බවත් පවසන ලදි

**ම. සෞ. පරීක්ෂක, පී. එස්. එස්. ද සිල්වා මහතා.**

මේ හේතුව නිසා මෙම වැසිකිළිවල මසකට දෙතුන් වතාවක් හිස් කිරීමට සිදුවන බව පවසන ලදි.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ වත්මන් ගරු සභාපති ඩබ් කමල් ද සිල්වා මහතා

මේ සමබන්ධයෙන් පරික්ෂා කර බලා සුදුසු නිර්දේශයන් ලබා දෙන ලෙස කර්මාන්ත අධිකාරී දැනුවත් කරන ලෙස දන්වන ලදි.

❖ **වෙනත් කරුණු**

**අම්බලන්ගොඩ නගර සභාවේ වත්මන් ගරු සභාපති ඩබ් කමල් ද සිල්වා මහතා**

කසල එකතු කිරීම පිලිබඳ ගැටළු පවතින්නේද යන්න විමසන ලදි.

**සෞඛ්‍ය පරිපාලක එම්.ඩබ්.එච්.එස්.චිත්‍රාවංශ මහතා.**

ට්‍රැක්ටර් රථවල නිතර අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට සිදුවන බැවින් අත්තිකාරම් ලබා දීම දැනට තාවකාලිකව නතර කර ඇති බව දැනගන්නට ලැබුණු බවත් එයට විසදුමක් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

**ප්‍රධාන කළ, සහකාර එස්, ඩී, රාමනායක මහත්මිය**

විමර්ශන නිලධාරි මහතා විසින් ලබා දි ඇති වාර්තාව අනුව අත්තිකාරම් ගෙවීම තාවකාලිකව නවත්වා ඇති බව පවසන ලදි.

**අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් භාරත සමරසේකර මහතා.**

මේ සම්බන්ධව අද දින පැවති කළමණාකරන කමිටුවේදි සාකච්ඡා කළ බවත් වාහනයක සුළු නඩත්තු කටයුත්තක් ඉටු කර ගැනිමට අවශය ද්‍රව්‍ය ගබඩාව හරහා ලබා ගැනිමේ පහසුකම් සැපයීම පිළිබඳ සාකච්ඡා කළ බවත් පවසන ලදි

**ගරු නගර සභා මන්ත්‍රීනී භාෂිණී විජේසූරිය මහත්මිය**

බන්දු විජේසූරිය කලායතනය අසලතබා ඇති කසල බඳුනට පිටතින් පැමිණෙන පුද්ගලයන් විසින් කසල දැමීම නිසා දැඩි දුර්ගන්දයක් හමන බවත්, ඉතා අපිරිසිදු බවත්, එම කසල බඳුන එම ස්ථානයෙන් ඉවත් කරන ලෙසත් පවසන ලදි.

**අම්බලන්ගොඩ නගර සභාවේ වත්මන් ගරු සභාපති ඩබ් කමල් ද සිල්වා මහතා**
එම ස්ථානයෙන් කසල බඳුන වහාම ඉවත් කිරිමට කටයුතු කරන ලෙසට හිරාන් මහතාට උපදෙස් දෙන ලදි. ලංකා බැකුව අසල ඇති කසල බදුන නිතර ගවයන් විසින් පෙරළගෙන අපද්‍රව්‍ය ආහාරයට ගන්නා බවත් එම තත්වය අශෝභන බවත් එම බඳුන ඉවත් කරන ලෙසත් උපදෙස් දෙන ලදි.

**ම. සෞ. පරීක්‍ෂක, පී. එස්. එස්. ද සිල්වා මහතා.**
පුස්තකාලය අසල ආපන ශාලාව තුළින් පිටවන අපජලය ප්‍රශ්නය පිලිබඳ පුස්තකාල කමිටු සාමාජික මහතකු තමාට නිතර කරදර කරන බවත්, මෙම ගැටළුව විසඳිම සඳඳහා නගර සභා පාර්ශවයෙන් ඉටුවිය යුතු කාර්‍ය ඉටු කරන ලෙසත් පවසන ලදි.

**අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් භාරත සමරසේකර මයා**
මේ පිළිබඳ අවශ්‍ය පියවර ගැනිම සඳහා කර්මාන්ත අධිකාරී වෙත දැනුම් දී ඇති බව පවසන ලදි.

**ම. සෞ. පරීක්‍ෂක, පී. එස්. එස්. ද සිල්වා මහතා.**
මුදල් ගෙවා කසල ඉවත් කිරිමේ කටයුතු නියමිත පරිදි සිදු නොවීම නිසා තමා අපහසුතාවයන්ට ලක්වන බව පවසන ලදි.

**අම්බලන්ගොඩ නගර සභාවේ වත්මන් ගරු සභාපති ඩබ් කමල් ද සිල්වා මහතා**
සේවයේ යෙදි සිටින පිරිස දින හතට වෙන් කර වැඩසටහනක් සකස් කරන ලෙස දැනුම් දුන්නද එය ක්‍රියාත්මක නොවූ බවත් ඉතා ඉක්මණින් එම වැඩසටහන සකස් කරන ලෙසත් හිරාන් මහතාට උපදෙස් දෙන ලදි.. එම වැඩසටහන සකස් කර ලේකම් මහතා අත්සන් කිරීමෙන් අනතුරුව පිටපත ම. සෞ. ප. සංජීව මහතාට ලබා දී වැඩසටහන ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙන ලදි.
**ගරු නගර සභා මන්ත්‍රීනී භාෂිණී විජේසූරිය මහත්මිය**
තමාගේ දුවට හා නිවස අසල තවත් කිහිප දෙනෙකුට ඩෙංගු රෝගය වැළදුණු බවත් ප්‍රකාශ කරන ලදි.

**අම්බලන්ගොඩ නගර සභාවේ වත්මන් ගරු සභාපති ඩබ් කමල් ද සිල්වා මහතා**
එම ප්‍රදේශයේ ධූමායන කටයුතු සිදු කරන ලෙස ම.සෞ.ප. මහතුන් වෙත උපදෙස් දෙන ලදි.

**<u>ස්තූති කථාව</u>**

**ගරු නගර සභා මන්ත්‍රීනී භාෂිණී විජේසූරිය මහත්මිය**
අම්බලන්ගොඩ නගරයේ සෞඛ්‍ය කටයුතු සාර්ථකව ඉටු කිරීම සඳහා සභාපතිතුමා ගන්නා වූ ප්‍රයත්නයට ස්තූතිය පුද කරමි. අද දින රැස්වීම සඳහා පැමිණි සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තූතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදී.

ප.ව.4.15 ට පමණ රැස්වීමේ කටයුතු නිම කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි අරුණ ප්‍රදීප් මහත්තය නිවාඩු අරගෙනද ගියේ. ඉල්ලල අස්වෙලාද ගියේ.

<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

නිවාඩු අරගෙන ගියේ.

ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්

මම මේ ඔබතුමාට විරුද්ධ වෙනව නෙමෙයි. මේ සෞඛ්‍ය කමිටු වාර්තාවෙ තියෙන්නෙ වත්මන් සභාපති කියල සඳහන් වෙලා. නගර සභා ආඥා පනතක් තියෙනවා. මෙහෙම එළියට ගියහම ඒක වැරදියි. මේක ලියපු කෙනා ආඥා පනත බලල මේක නිවැරදි කල යුතුයි. ආඥා පනත අනුව සභාපතිවරයා නිවාඩු යනකොට පත් කරන්නෙ වැඩ බලන සභාපතිවරයෙක්.

ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

අපි ඒක පිලිගන්නවා. මේක නිවැරදි කරන්න.

ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්

මේ දේවල් අලුතින් පත්වීම් ලබල ආපු නිලධාරීන්ට පුහුණුවීම් දෙන්න ඕනෙ. මම දැක්ක පුහුණු සම්බන්ධවත් ලිපියක් දාල තියෙනවා. මේ පුහුණුවක් නැතිකම නිසා තමයි මේ විදියට වාර්තා ලියන්නෙ. මම කමල් මහත්මයත් එක්ක කිසි ප්‍රශ්නයක් නැහැ. අරුණ ප්‍රදීප් මහත්තය පළාත් සභාවට ගියහම ඔබතුමාට මේක ලැබෙනවා. නමුත් ඊට ඉස්සෙල්ල අපට කතා කරන්න බැහැ නව සභාපති කියලා. ඔබතුමා නෙමෙයි මේකට වග කියන්න ඕනෙ. මේක ලියපු අය. මේවගේ කටයුතු වලදී දැඩි අවධානය යොමු කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්

සභාපතිතුමනි මට ප්‍රශ්නයක් තියෙනවා. එහෙම අවශ්‍යද කියල. එතකොට සභාව අමතන්න වෙන්නෙත් වැඩ බලන සභාපති කියලනෙ. ඔබතුමාට නීත්‍යානුකූලව තනතුරෙන් ලැබිල තියෙන්නෙ වැඩ බලන සභාපති ධූරය බව මම පිළිගන්නවා. හැබැයි මේ සභාවට අගෞරවයක් වෙනව සභාපතිවරය නොවෙනවනම්. ඒක බලල වෙනස් කරන්න. අපි සභාව අමතන්නෙ සභාපතිවරයාට. ඒනිසා කොමසාරිස්තුමාගෙන් හෝ විමසල නිවැරදි දේ කරන්න. පනතෙ තියෙනව සභාපතිතුමා නැති වෙලාවට උප සභාපතිවරයාත් නැත්තම් මේ ගරු සභාවෙ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් තමයි සභාව මෙහෙයවන්නෙ.

ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

පනත බලල එය නිවැරදි කරන්නම්.

ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්

අපිට න්‍යාය පත්‍රය එවල තියෙන්නෙ වාර්තාවෙ අත්සන් කරල තියෙන්නෙ වැඩ බලන සභාපති කියල. ඒක හරි. මම දන්නව සභාපති පත් කරන විදිය. මෙතන තියෙන වචනෙ වැරුද්ද මම කියන්නෙ.

ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

පනතෙනම් මම එහෙම දෙයක් දැක්කෙ නැහැ. ඔබතුමා කතා කරේ සභාවෙ ගරුත්වය රකින්නනෙ. එනිසා මම මෙම වාර්තාව අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්

සභාපතිතුමනි අපි කාණු පද්ධති ශුද්ධ කිරීම සඳහා සේවකයන් බඳවා ගන්න තීරණය කරා. ඒකෙ තත්වය කොහොමද?

ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

මම උපදෙස් දුන්නා පී. එච්. අයි. මහත්මයට ඒ කාණු ටික ශුද්ධ කරල සෝදන්න කියලා. බඳවා ගැනීමක් නම් තාම කරේ නැහැ. ඉදිරියේදී ඒ සඳහා සාකච්ඡා කරල බඳවා ගැනීමට කටයුතු කරන්නම්.

ඒ අනුව **2014 -02- 20** දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(07)** ටෙන්ඩර් හා මිල ගණන්

**7:1** ටෙන්ඩර් හා මිළගණන් :-

**7:1:1** ටෙන්ඩර් :- නැත

**7:2** මිල ගණන් :-

**7:2:1** මාර්ග තලනය අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඩී. පී. ආනන්ද | ගාමිණී ලේත් වර්ක්ස් ඇන්ඩ් අයන් වර්ක්ස් | නිහාල් ඉංජිනියරින් වර්ක්ස් |
|---|---|---|---|---|---|
| 01 | මාර්ග තලනයට අවශ්‍ය කොටස් දමා අලුත්වැඩියා කිරීම | | 17500/- | 18600/- | **16500/-** |
| | | | | | |

**7:2:2** **SL- 3731** අත් ට්‍රැක්ටරයේ ගියර් පෙට්ටිය අලුත්වැඩියාව සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | නිව් හවානා මෝටර් ස්ටෝර්ස් | අමන්දා මෝටර්ස් | ඇල්ෆ්‍රඩ් ද සිල්වා සහ සමාගම |
|---|---|---|---|---|---|
| 01 | 6303 - රේසර් | | **540/-** | 560/- | - |
| 02 | 6208 - රේසර් | | **1075/-** | 1100/- | 1150/- |
| 03 | 6204 - රේසර් | | **400/-** | - | 450/- |
| 04 | 6305 - රේසර් | | **690/-** | 725/- | - |
| 05 | ඔයිල් සීල් සෙට් | | - | - | - |
| 06 | සෙලාස්ටික් ගම් | | **460/-** | 490/- | 475/- |

**7:2:3** 37.5kg ගෑස් සිලින්ඩර් සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | බිංදුහේවා සේල්ස් අවුට්ලට් | මිළිඳු එන්ටර්ප්‍රයිසස් | එම්.පී.ද සිල්වා සේල්ස් අවුට්ලට් |
|---|---|---|---|---|---|
| 01 | 37.5kg ගෑස් සිලින්ඩර් | | 7230/- | **<u>7218/-</u>** | 7220/- |
| | | | | | |

**(08)** ගෙවීම්

8. 1 ඇ. අංක 0952 යටතේ ගබඩාවට ලබාගන්නා ලද භාණ්ඩ සඳහා අම්බලන්ගොඩ, විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි, රු. 19100/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| හාපික් | 150/- X 35 | - | 5250/- |
| ෆයිනොල් | 130/- X 25 | - | 3250/- |
| ලයිෆ්බෝයි | 200/- X 45 | - | 9000/- |
| එයාර් ෆ්‍රෙෂ්නර් | 320/- X 05 | - | 1600/- |

8.2 ඇ. අංක 0744 යටතේ ගබඩාවට ලබා ගත් ගල් සඳහා තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ, කේ. කේ සුමිත් ප්‍රියන්ත මෙන්ඩිස් මයා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 52050/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| 1 ½ ගල් 3950/- X 9 | - | 35550.00 |
| චිප්ස් ගල් 5500/- X 3 | - | 16500.00 |
| Pen Drive 4 GB 700 X 1 | - | <u>700.00</u> |
| | | <u>52050.00</u> |

8. 3 ඇ. අංක 971 යටතේ ගබඩාවට ලබා ගත් කෝලාස් සඳහා කොළඹ 10 , ලංකෙම් සිලෝන් ලිමිටඩ් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 103600/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| කෝලාස් බැරල් 5 X 18500/- | - | 92500.00 |
| VAT | -´ | <u>11100.00</u> |
| | | <u>103600.00</u> |

8.4 ඇ. අංක 0969 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද සිමෙන්ති කොට්ට වෙනුවෙන් අම්බලන්ගොඩ, මහා වීදිය, බී. කේ. එස්. කම්පැනි වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 22750/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

සිමෙන්ති 25 X 910/- - 22750.00

8.5 ඇල මාර්ග ශා කාණු ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා JCB යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන් බටපොල පාර කහව මහින්ද කොන්ක්‍රීට් වර්ක්ස් හි මහින්ද ත්‍රිමාවිතාන මයා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 64600/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.6 ඇ. අංක 0973 යටතේ ලබා ගන්නා ලද Gas සඳහා අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ, එම්. පී. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 65160/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 37.5 kg LP Gas | 9 X 7240 | - | 65160/- |

8.7 ඇ. අංක 0957 යටතේ ලබා ගන්නා ලද ටෝනර් වෙනුවෙන් අම්බලන්ගොඩ, වික්‍රමසූරිය පාර, ඔමැක් ටෙක්නොලොජි වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 20250/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Hp 85 A Toner | 3 X 6750/- | - | 20250/- |

8.8 ඇ. අංක 0777 යටතේ ලබා ගන්නා ලද පරිගණක උපාංග සඳහා අම්බලන්ගොඩ, ගාලු පාර, ටියුලිප් කම්පියුටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 723900/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| CPU | 15X 34600/- | - | 51900/- |
| Monitor | 12X 11700/- | - | 140400/- |
| UPS | 15X 4300/- | - | 64500/- |
| | | | 723900/- |

8.9 ඇ. අංක 0955 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද භාණ්ඩ සඳහා අම්බල්නගොඩ, ගාලු පාර, උමංග ලුබ්රිකන්ට්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 48475/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| හයිඩ්‍රොලික් ඔයිල් | 40 X | - | 15800/- |
| පවර් ඔයිල් | 5 X 835/- | - | 4175/- |
| ග්ලාස් ක්ලීනර් | 2 X 175/- | - | 350/- |
| හයි ප්‍රෙෂර් | 1 X 700/- | - | 700/- |
| කාර් වොෂ් | 1 X 800/- | - | 800/- |
| ග්‍රීස් | 25 kg X 600/- | - | 15000/- |
| බැටරි වතුර | 05 X 60/- | - | 300/- |
| ඩෙලෝ ගෝල්ඩ් | 1 X 7300/- | - | 7300/- |
| ඩෙලෝ මැනුවල් | 1 X 4050/- | - | 4050/- |
| | | | 48475/- |

8.10 ඇ. අංක 0972 යටතේ ලබා ගන්නා ලද කාර්යාල උපකරණ සඳහා අම්බලන්ගොඩ, ගාලු පාර, පත්මා ෆර්නිචර් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 21000/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 3' X 6' වානේ අල්මාරි | 2 X 10500/- | - | 21000/- |

8.11 ඇ. අංක 0951 යටතේ ලබා ගන්නා ලද වරිපනම් බදු බිල්පත් සඳහා සමගි මාවත දෙහිවල ග්‍රාක් කම්පියුටර්ස් ෆෝම්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 35000/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Computer Bills | 10 X 3500/- | - | 35000/- |

8.12 ඇ. අංක 0318 යටතේ 252-0730 කැබ් රථයේ රේඩියේටරය සැකසීම වෙනුවෙන් අම්බලන්ගොඩ, පොල්වත්ත DN එන්ටර්ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 30200/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.13 53- 0529 කැබ් රථයේ අලුත්වැඩියාව සඳහා අලුත්ගම පාර, ඇල්පිටිය එස්. එම්. මෝටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 16390/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.14 ඇ. අංක 0793 යටතේ ලබා ගත් ටයර් සඳහා ඇල්පිටිය පාර, අම්බලන්ගොඩ සුමිත් මාර්කටින් කම්පැනි ලිමිටඩ් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 18102/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 185 X 14 ටයර් | 2 X 9051/- | - | 18102/- |

8.15 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2014 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 20522.30 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4483 | ඩීසල් | 58 |
| | එන්ජින් ඔයිල් | 1/2 |
| 4497 | ඩීසල් | 57 |
| 4502 | ඩීසල් | 53 |

8. 16 නගර සභාව සතු 49 - 9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10018.10 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4489 | ඩීසල් | 39 |
| | එන්ජින් ඔයිල් | 04 |
| 4503 | ඩීසල් | 32 |

8.17 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10896.80 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4480 | ඩීසල් | 40 |
| 4496 | ඩීසල් | 48 |
| | බැටරි වතුර | බෝතල් 03 |

8. 18 නගර සභාව සතු 49 - 9436 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10370.80 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4495 | ඩීසල් | 38 |
| | එන්ජින් ඔයිල් | 02 |
| 4481 | ඩීසල් | 40 |

8.19 නගර සභාව සතු LF-1853 අංක දරණ ටිපර් රථය සඳහා 2014 ජනවාරි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15258.60 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4518 | ඩීසල් | 60 |
| 4527 | ඩීසල් | 66 |

8.20 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසර රථය සඳහා 2014 ජනවාරි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 18883.30 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4533 | ඩීසල් | 153 |
| | එන්ජින් ඔයිල් | 01 |

8.21 නගර සභාව සතු RA-8796 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 ජනවාරි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 16829.60 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4510 | ඩීසල් | 35 |
| | එන්ජින් ඔයිල් | 02 |
| | කූලන්ට් ඔයිල් | 04 |
| 4525 | ඩීසල් | 43 |
| 4535 | ඩීසල් | 38 |

8.22 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 ජනවාරි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13312.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4505 | ඩීසල් | 34 |
| | හයිඩ්‍රොලික් ඔයිල් | 01 |
| 4522 | ඩීසල් | 37 |
| 4536 | ඩීසල් | 36 |

8.23 නගර සභාව සතු 49- 9436 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 ජනවාරි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13797.10 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4506 | ඩීසල් | 31 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4524 | ඩීසල් | 41 |
| 4537 | ඩීසල් | 39 |

8.24 නගර සභාව සතු 49- 9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 ජනවාරි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13045.20 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4507 | ඩීසල් | 20 |
| | එන්ජින් ඔයිල් | 05 |
| 4523 | ඩීසල් | 22 |
| | එන්ජින් ඔයිල් | 02 |
| 4534 | ඩීසල් | 32 |
| | එන්ජින් ඔයිල් | 03 |

8.25 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2014 ජනවාරි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 29592.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | | ප්‍රමාණය ලීටර් |
|---|---|---|---|
| 4504 | ඩීසල් | | 60 |
| 4512 | ඩීසල් | | 50 |
| 4517 | ඩීසල් | | 35 |
| | බැටරි වතුර | බෝතල් | 01 |
| 4521 | ඩීසල් | | 40 |
| 4528 | ඩීසල් | | 54 |
| | එන්ජින් ඔයිල් | | 01 |

**මෙම ගෙවීම සඳහා ඡන්දය විමසනු ලදුව ගෙවීමට පක්ෂව ගරු සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජ්. පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය , ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමණයගේ මහතා ගරු නගර සභා මන්ත්‍රී ජ්. ඩබ්. ජගත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. හාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය යන අයද , විපක්ෂව ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා යන අයද ඡන්දය ප්‍රකාශ කල අතර වැඩි ඡන්ද පහකින් මෙම ගෙවීම සභා සම්මත විය.**

8.26 තල්ගස්ගොඩ පුංචි පාලම අසල සිට මහ පාලම දක්වා මාර්ගය අයිනේ එක් පැත්තක ශරීර සුවතා මංතීරු ඉදි කිරීමේ කර්මාන්තයේ පළමු කොටස් ගෙවීම වන රු. 46382.49 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි කුරුදුගහ හැතැප්ම පාසල්කන්ද 273/1, ඩී. කේ. එස්. බිල්ඩර්ස් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.27 මාර්ග තලනය කලුවඩුමුල්ල ප්‍රදේශයේ බෑවුම් සහිත ස්ථානයකදී අනතුරට ලක් වීමෙන් පසු නැවත ගොඩ ගැනීම සඳහා ජගංම දොඹකරයක් භාවිතා කිරීම වෙනුවෙන් රු. 13440.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි විස්කම් කොන්ක්‍රීට් වර්ක්ස් (පෞද්ගලික) සමාගම වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.28 නගර සභාවට අයත් LF- 1853 ටිපර් රථයේ හා 252-0730 අංක දරණ කැබ් රථයේ ආදායම් බලපත්‍ර ලබා ගැනීමේ කාර්ය සඳහා රු. 18260.00 ක් වන ඇස්තමේන්තුව සඳහා සරප්/ වැඩ අධිකාරී මගින් අත්තිකාරම් මුදල් ලබා ගැනීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.29 LF- 1853 අංක දරණ ටිපර් රථයේ රක්ෂණ වාරිකය ලෙස රු. 27024.92 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.30 අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් 2013 නොවැම්බර්, දෙසැම්බර් සහ 2014 ජනවාරි මාස සඳහා රු. 14166.67 ක මුදලක් ගණකාධිකාරී නිර්දේශය පරිදි භාරත සමරසේකර මහතාට ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:31 2013 නොවැම්බර් මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 I | 47106.77 |
| 23453 I | 2280.01 |
| 34453 I | 3185.63 |
| 52453 I | 64356.01 |
| 53454 | 16184.25 |
| 62453 I | 28371.90 |
| | 161484.57 |

විදුලි බිල්පත් සඳහා රු. **161484.57** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:32 2013 නොවැම්බර් මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 52453 II | 23454.10 |
| 62453 II | 12995.50 |
| 34453 II | 1024.80 |
| 23453 II | 15640.78 |
| 11453 II | 9181.76 |
| | **62296.94** |

ජල බිල්පත් සඳහා රු. **62296.94** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:33 2013 නොවැම්බර් මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11452 | 29666.25 |
| 12452 | 1163.28 |
| 25451 II | 2518.80 |
| 62452 I | 5019.11 |
| | **38367.44** |

දුරකතන බිල්පත සඳහා රු. **38367.44** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:34 k.r iNdj u.ska md,kh jk mqia;ld, i|yd 2014 ckjdrs udihg imhk ,o mqj;am;a fjkafjka re' 38415.00 l uqo,la f,alïf.a ks¾foaYh mßos tï' tia' ùrisxy uy;d fj; f.ùug iNdfõ wkque;sh ,nd fok ,oS'

8:35 2014 ckjdß ui VAT uqo,a wdmiq f.ùu fjkqfjka re' 50000/- l uqo,la f,alïf.a ks¾foaYh mßos foaYSh wdodhï flduidßia ckrd,a fj; f.ùug iNdfõ wkque;sh ,nd fok ,oS'

8:36 mskak¥j t,a' iS' o is,ajd mdf¾ jx.= fldgi mq¨,a lsÍu i|yd jßmkï wxl 51/1 orK ia:dkfha me;s neïu boslsÍu l¾udka;fha /|jqï uqo, jk re' 26111.05 l uqo,la jev wêldÍ yd f,alïf.a ks¾foaYh mßos flrñKsh l=vd .ïudk iñ;sh fj; f.ùug iNdfõ wkque;sh ,nd fok ,oS'

8:37 flrñKsh fmdl=K mdf¾ ldKQ fldgila boslsÍu l¾udka;fha /|jqï uqo, jk re' 22855.14 l uqo,la jev wêldÍ yd f,alïf.a ks¾foaYh mßos flrñKsh l=vd .ïudk iñ;sh fj; f.ùug iNdfõ wkque;sh ,nd fok ,oS'

8:38 iNdj i;= 53-0529 wxl orK leí r:fha 2013-02-20 osk isg 2014-07-20 osk olajd wdodhï n,m;%h ,nd .ekSug re' 14850/- la f,alïf.a ks¾foaYh mßos ol=Kq m<d;a fudag¾ r: m%jdyk fldmuidßia fj; f.ùug iNdfõ wkque;sh ,nd fok ,oS'

## (09) ගිණුම්

**9:1** 2014 ජනවාරි මාසයේ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2014 ජනවාරි මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති කමල් වැල්ලගේ මහතාගේ හා ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

**10:1** තල්ගස්ගොඩ පෙර පාසල ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 712062.12 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:2** හල්වතුර ප්‍රදේශයේ ක්‍රීඩා පිටයක් ඉදිකිරීමේ කර්මාන්තය (I අදියර) වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 1213421.40 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:3** හල්වතුර ප්‍රදේශයේ ක්‍රීඩා පිටයක් ඉදිකිරීමේ කර්මාන්තය (II අදියර) වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 372141.75 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:4** මුහුදු වෙරළහරස් පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 59453.46 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මම දැනගන්න කැමතියි මේ මුහුදු වෙරළ පිවිසුම් මාර්ගය තියෙන්නෙ කොහේද කියලා. ඒවගේම මේ වෙනකොට මේ ඇස්තමේන්තුව සම්මත කර ගන්නටත් පෙර මම යෝජනා කරනව මේ පාර හදල තියෙන්නෙ කියලා. මම දැනගන්න කැමතියි මේපාර පවරාදීමක් සිදු කලාද නගර සභාවට? ඒ පවරා දීමේදී නිවාස හිමියන් කී දෙනෙක් මේ සඳහා අත්සන් කරාද? මම හිතන්නෙ හිටපු සභාපතිතුමා නිවාඩු ගැනීමෙන් පස්සෙ වත්මන් සභාපතිවරයා ලෙස ඔබ මේ ගැන දැනුවත්වී සිටියාද? මේ කාරණා ගැන මම ඔබතුමාගෙන් දැනගන්න කැමතියි.

<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ඔබතුමා අසන ලද ප්‍රශ්න වලට පිලිතුරු දීමට මම ලබන මාසෙ සභාවට කල් තියනවා. නිලධාරීන්ගෙන් දැනුවත් වීමෙන් පසුව පිළිතුරු ලබන සභාවට ලබා දෙන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ පාර හදල තියෙන්නෙ.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපේ නිවාඩු ලබා සිටින ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි වැඩ අධිකාරී විසින් සකස් කරන ලද ඇස්තමේන්තුවට අනුව සභාපතිතුමාට පැවරී ඇති බලතල අනුව ඒ මාර්ගය ඉදි කරල තියෙනවා. ඔබතුමාලට අවශ්‍ය නම් විරුද්ධ වෙන්න පුලුවන් නැත්තම් පක්ෂ වෙන්න පුලුවන්. ඔබතුමාත් ඒ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

මගේ මේකට විරුද්ධයක් නැහැ. මම අහන්නෙ මේ පාර දැනටත් හදල ඉවර නිසයි.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මම තමුන්නාන්සෙ අහපු ප්‍රශ්න වලට ඊළඟ සභාවෙදි පිළිතුරු දෙන්නම්. මෙම ඇස්තමේන්තුවට විරුද්ධ අය ඉන්නවද? විරුද්ධ අය නැත්තම් මෙම ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දෙනවා.

**තීරණය**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:5** අශෝක උයන මාර්ගය අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 209197.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දුන් අතර සෘජු ශ්‍රමකුලී පදනම මත ඉටු කිරීමට ද සභාව තීරණය කරන ලදී.**

**10:6** පලාදුව පාර අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 459555/- ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මේ ඇස්තමේන්තුව න්‍යාය පත්‍රයේ නැහැ.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මේක අද උදේ ආවෙ. තමුන්නාන්සෙ කියනව නම් මම මේක ලබන සභාවට දාන්නම්. හැබැයි මෙතන වැඩි හරියක් ඉන්නෙ තමුන්නාන්සේලාගෙ පාක්ෂිකයො.

තීරණය

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:7** ජාතික සෞඛ්‍ය සතිය වෙනුවෙන් සකස් කරන ලද වැඩසටහන හා ඊට අදාල සංවර්ධන සහකාර මහත්මිය විසාන් සකස් කරන ලද re' 18000.00 ක් වු වියදම් ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☛ **මෙම වැඩසටහන සහ ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී**

## (11) වෙනත් කරුණු

11:1 " පෙර බදු කරුවන් විසින් නොගෙවන ලද කඩ කුලී සම්බන්ධවයි " මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

පෙර බදු කරුවන් විසින් නොගෙවන ලද හිග දැක්වෙන ලැයිස්තුවක් නගරයේ තැනින් තැන ප්‍රදර්ශනය කල බවත් එහිදී ආර්. එම්. දේව් රොහාන් ද සිල්වාගේ නමින් තිබු හිග මුදල වන රු. 306.60 ක මුදල පමණක් ගෙවීම් කල බවත් මෙම හිගය ඉදිරියට ගෙන යාම විගණන විමසුම් වලට හේතු විය හැකි බවත් එමනිසා මෙම හිගය කපා හැරීම සම්බන්ධයෙන් සභාවේ උපදෙස් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☛ **පළාත් පාලන කොමසාරිස්තුමාගේ සහ ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගෙන හිග කපා හැරීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

11:2 " පළාත් පාලන ආයතනවල ආදායම් ප්‍රවර්ධන පිළිබඳ සාකච්ඡාව " මැයෙන් මුදල් කොමිෂන් සභාවේ ලේකම්තුමා වෙත යවන ලද ලිපියේ පිටපත සභාගත කරන ලදී.

ඔබේ අංක FC/WP/6/4/2014 දරණ 2014-02-05 දිනැති ලිපිය හා 2014-02-18 දින පැවති සාකච්ජාව අනුව නගර සභාවට අදාල වු යෝජනා පහත පරිදි දක්වා තිබුණි.

I හිග වරිපනම් අය කිරීම කඩිනම් කිරීම සඳහා දැනට පවතින නීති රාමුව වෙනස් කර නඩු පැවරීමට හැකි වන පරිදි නීති සංශෝධනය කිරීම.

II නගර සභා ආඥා පනතේ 165 ඇ (1) යටතේ සංවර්ධනය නොකළ ඉඩම් වලින් බදු අය කිරීම

III අම්බලන්ගොඩ බල ප්‍රදේශයේ දැනට ඇති සියලු වානිජ්‍ය බැංකු සමග සම්බන්ධවී නගර සබා පොදු ස්ථාන වල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) බදු කුලී පදනම යටතේ ස්ථාන ගත කිරීමට කටයුතු කිරීම.

IV කොම්පෝස්ට් ව්‍යාපෘතියේ වැඩ කටයුතු කඩිනම් කිරීම

V ක්‍රීඩා භූමි නඩත්තු කිරීම හා ක්‍රීඩා උපකරණ මිලදී ගැනීමට අනුග්‍රාහක පහසුකම් සලසන ආයතන හා පුද්ගලයන් සම්බන්ධ කර ගැනීම

VI නගර සභා බල ප්‍රදේශයේ දේපල වල තක්සේරු වටිනාකම් යාවත්කාලීන කිරීම.

VII නගර සභා අරමුදල් වැය කිරීමේදී වඩාත් පිරිමැසුම්දායීව වැය කිරීම.

තීරණය

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

- **පෙ. ව. 11.00 ට පමණ තේ විවේකය සඳහා සභාව නතර කරන ලදී.**
- **පෙ. ව. 11.10 ට පමණ නැවත සභාව ආරම්භ කරන ලදී.**

- **පෙ. ව. 11.10 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය සභා ගර්භයෙන් නික්ම යන ලදී.**

11:3 " කායවර්ධන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම " ලිපිය පසුගිය සභාවේ සභාගත කරන ලද ලිපියකි.

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** ' 2014 ජනවාරි මස ආදායම් වාර්තාව ' මැයෙන් ප්‍රධාන ආදායම් කළමනාකරණ සහකාර මිය විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2014 ජනවාරි මාසයේ ආදායම් ශීර්ෂ යටතේ ඇස්තමේන්තුව, සත්‍ය ආදායම හා වෙනස ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☞ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:2** ' 2013 - වැය ලේඛණ විස්තර- ජනවාරි සිට දෙසැම්බර් දක්වා අංක 1, 2, 3, 5 සහ 6 වැඩ සටහන ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2013 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☞ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:3** ' 2014 වැය විස්තර ඉදිරිපත් කිරීම - වැඩ සටහන 1, වැඩ සටහන 2, වැඩ සටහන 3, වැඩ සටහන 5, වැඩ සටහන සහ 2014 වැය විස්තර පොදු ගිණුම වෙනත් ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තා සභාගත කරන ලදී.

2014 ජනවාරි මස වැඩසටහන 1 හි, වැඩසටහන 2 හි, වැඩසටහන 3 හි, වැඩසටහන 5 හි, වැඩසටහන 6 හි සහ පොදු ගිණුමට අදාලව වෙනත් විෂයන් යටතේ වැය විස්තර ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:4** ' අවදානමින් වාහන පැදවීම සම්බන්ධව ' මැයෙන් ටී. එච්. ඩබ්ලිව්. නිවාස අංක 01 සිට 57 දක්වා ප්‍රධාන පාර අසළ සිටින නිවැසියන් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අප නිවෙස් ඉදිරිපිට තිබෙන ප්‍රධාන මාර්ගයේ ඉතා වේගයෙන් අනාරක්ෂිත ලෙස වාහන ධාවනය වන බවත් අප නිවෙස්වල මිදුලක් නොමැති නිසා කුඩා ළමුන් පාරේ සෙල්ලම් කරන බවත් වේගයෙන් ධාවනය වන වාහන නිසා අනතුරු සිදුවීමට ඉඩ ඇති බවත් මේ සම්බන්ධව අවදානය යොමු කොට මෙම මාර්ගයට මාර්ග බාධක යොදා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**
සභාපතිතුමනි සක්වා එක ලග නවාරා පංතියට යන පාරෙත් ඔය ප්‍රශ්නෙ තියෙනවා. එතන නම් පොඩි පාරක්. මෙතන නිවාස යෝජනා ක්‍රමයක් නිසා ප්‍රශ්නයක් වේවිද දන්නෙ නැහැ. ගොඩක් අය ඉන්න නිසා.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
මෙතන ඉල්ලීම කරල තියෙන්නෙ ප්‍රධාන පාරෙ ඉන්න අය විතරයි. අනිත් පාරවල් පොඩි ඒව. ඒවගෙ එච්චර ප්‍රශ්නයක් නැහැ. මේ පාරෙ නිවාස 18 අය තමයි කෙලින්ම පාරට බහින්නෙ. අපි පොලිසියෙනුත් උපදෙස් අරගෙන මේ වැඩේ කරමු.

<u>තීරණය</u>

☛ **මේ සම්බන්ධව පොලිසිය දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:5** ' අම්බලන්ගොඩ අන්තර් ක්‍රීඩා සමාජ මලල ක්‍රීඩා උළෙල - 2014 ' මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014 වර්ෂයේ පැවැත්වෙන XL වන ජාතික මහා ක්‍රීඩා උළෙලේ ප්‍රථම අදියරේ තරග යටතේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තරග 2014-03-08 දින අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩා පිට්යේදී පැවැත්වෙන බවත් එදිනට අවශ්‍ය කොඩි කණු 20 ක් හා ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා අවශ්‍ය විදුලිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **2014-03-08 දින පැවැත්වෙන තරග සඳහා කොඩි කණු 20 ක් මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:6** ‘ බැංකුව සෘජු අය කිරීම් ගිණුම්ගත කිරීමට අනුමැතිය ලබා ගැනීම. 2013 නොවැම්බර්/ දෙසැම්බර් “ මැයෙන් පොත් තබන නිලධාරිණිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

මහජන බැංකුව විසින් සෘජුවම අයකරගෙන ඇති බැංකු ගාස්තු හා වෙනත් ගාස්තු වෙනුවෙන් රු. 2.54 ක මුදලක් වියදමක් වශයෙන් ගිණුම්ගත කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **බැංකුව අයකරගෙන ඇති බැංකු ගාස්තු හා වෙනත් ගාස්තු සඳහා වන රු. 2.54 ක මුදලක් වියදමක් වශයෙන් ගිණුම්ගත කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:7** ‘ වැඩ බැලීමේ දීමනාව ලබා ගැනීම සම්බන්ධවයි “ මැයෙන් ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

හික්කඩුව නගර සභාවේ සේවයේ නියුතු ආයුර්වේද වෛද්‍ය ඩී. එම්. නන්දසිරි මහතාට අම්බලන්ගොඩ නගර සභාවේ ආයුර්වේද වෛද්‍ය තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් ආයතන සංග්‍රහය ප්‍රකාර ආරම්භක වැටුපෙන් 25% ක දීමනාව වන රු. 5000/- ක මුදලක් ගෙවීමට අනුමත කල බව දන්වා තිබුණි.

<u>තීරණය</u>

☛ **ආයුර්වේද වෛද්‍ය ඩී. එම්. නන්දසිරි මහතාට අම්බලන්ගොඩ නගර සභාවේ ආයුර්වේද වෛද්‍ය තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් රු. 5000/- ක මුදලක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:8** ‘ අම්බලන්ගොඩ නගර සභාවේ ප්‍රධාන කාර්යාලයේ දුරකථන බිල සම්බන්ධවයි ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාවේ ප්‍රධාන කාර්යාලයේ අංක 091-2258275 දරණ දුරකථනයෙහි බිල 2013 දෙසැම්බර් සහ 2014 ජනවාරි මාසවල සභා දායකත්ව මුදල වන රු. 5000/- ක මුදල ඉක්මවා ඇති බවත් ඒ අනුව සභා දායකත්ව මුදල ඉක්මවා ඇති 2013 දෙසැම්බර් මාසය සඳහා රු. 1512.52 ක මුදලක්ද 2014 ජනවාරි මාසය සඳහා රු. 3364.15 ක මුදලක්ද ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

මේ වැඩිවීමට හේතුව විදියට නිලධාරීන් දක්වල තියෙනවා වයඹ සංවර්ධන අධිකාරියෙන් පරිගණක වැඩසටහනක් අරගෙන තියෙනවා. ඒකට නිතරම වයඹ සංවර්ධ අධිකාරියේ නිලධාරීන්ට දුරකථනයෙන් කතා කරන්න සිදුවීම නිසා තමයි මෙය වැඩිලා තියෙන්නෙ කියලා.

<u>තීරණය</u>

☛ **ප්‍රධාන කාර්යාලයේ අංක 091-2258275 දරණ දුරකථනයෙහි සභා දායකත්ව මුදල ඉක්මවා ඇති දුරකථදුරකථන ගාස්තුව වන රු. 4876.67 ක මුදලක් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:9** ‘ අංක SD/2013/07 දරණ අනුබෙදුම ’ සභාගත කරන ලදී.

අංක SD/2013/07 දරණ අනුබෙදුම් අයදුම්පතට අනුව අංක 01 කැබැල්ල මාදුවගේ කමල් තිලකසිරි යන අයටද අංක 02 කැබැල්ල මාදුවගේ ජගත් පියතුංග යන අයටද, අංක 03 කැබැල්ල මාදුවගේ නන්දනී කුසුමලතා යන අයටද, අංක 04 කැබැල්ල මාදුවගේ මාලා මංගලිකා යන අයටද, අංක 05 කැබැල්ල පොදු පාරක් සඳහාද, අංක 06 කැබැල්ල මාදුවගේ චන්ද්‍රා ගුණසීලි යන අය සඳහාද සහ අංක 07 කැබැල්ල මාදුවගේ කමල් තිලකසිරි යන අය යන සහෝදර සහෝදරියන් අතර බෙදා ගන්නා බැවින් 1% මුදල ගෙවීමෙන් නිදහස්වීම සඳහා නිවැරදි කර ලියා ඇති දීව්රුම් සහතිකයක් නැවත 2014-03-03 වන දින ඉදිරිපත් කර ඇති බවත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **ඉහත සඳහන් නම් වරිපනම් ලේඛනයේ සටහන් කිරීමේදී පමණක් 1% ගාස්තු අය නොකිරීමටත් වෙනත් නමකට හැරවීමේදී 1% ගාස්තු අය කිරීමට වරිපනම් ලේඛනයේ සඳහන් කිරීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:10** ‘ පළාත් පාලන කාර්ය සාධන තරගාවලිය - 2014 ’ මැයෙන් වැඩ අධිකාරී මහතා විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ඉහත වැඩ සටහන යටතේ නගර සභා දෙපස මාර්ග ශුද්ධ කිරීම, නගර සභා මාර්ග අලුත්වැඩියාව, නගර සභා කාණු පද්ධති අලුත්වැඩියාව, නගර සභා ගොඩනැගිලි අලුත්වැඩියාව සහ මාර්ග නාම පුවරු අලුත්වැඩියාව සිදු කරනු ලබන බවත් දන්වා තිබුණි.

<u>**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

වැඩ අධිකාරී මහතා විසින් මේක හදල තියෙන්නෙ. සංවර්ධනය විය යුතු පාරවල් පිළිබඳව විස්තරයක්. 2014 කාර්ය සාධන තරගය සඳහා අපි දැන්ම ඉඳන්ම සූදානම් විය යුතුයි. එම නිසා කර්මාන්ත අධිකාරීතුමා ඉදිරිපත් කරපු මෙම වාර්තාව අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:11** ‘ පොල්වත්ත වෙළඳ සංකීර්ණයේ ජල සම්බන්ධතාවය ’ මැයෙන් අභ්‍යන්තර විගණන නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

පොල්වත්ත වෙළඳ සංකීර්ණයේ 2013 සැප්තැම්බර් මාසයේ ජල බිල්පත ඒකක 492 ක් දක්වා වැඩිවීම පිළිබඳව පරීක්ෂා කර බැලූ බවත් එහිදී දැනගැනීමට හැකි වූයේ වෙළඳ සංකීර්ණයේ ඇති වැසිකිළියේ වැසිකිළි ලැල්ලට යටින් ජලනලය ගැලවීම නිසා මාසයක් පමණ කාලයක් ජලය අපතේ ගොස් ඇති බවත් එබැවින් ජල බිල්පත වැඩි වී ඇති බවත් ජල සම්පාදන මණ්ඩලය සමග සාකච්ඡා කොට සහනදායී ක්‍රමයක් යටතේ මෙම ගෙවීම සිදු කිරීමට හැකි බවත් බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☛ **ජල බිල්පත සහනදායි ක්‍රමයක් යටතේ ගෙවීම සඳහා ජල සම්පාදන මණ්ඩලයෙන් ඉල්ලීමක් කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:12** ' තල්ගස්ගොඩ පුංචි පාලම අසල සිට මහපාලම දක්වා මාර්ගය අයිනේ එක් පැත්තක ශරීර සුවතා මංතීරුව ඉදිකිරීමේ කර්මාන්තය ' මැයෙන් වැඩ අධිකාරී විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ඉහත කර්මාන්තය ගිවිසුම්ගත කාලය 2014-01-19 දිනෙන් අවසන් වන බවත් එම කාලය දීර්ඝ කර දෙන ලෙස කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලීම් කර ඇති බවත් ඒ අනුව මෙම කර්මාන්තයේ ගිවිසුම් කාලය දින 45 කින් ඉදිරියට දීර්ඝ කිරීමට කටයුතු සලස්වන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **ඉහත කර්මාන්තයේ ගිවිසුම්ගත කාලය දින 45 කින් දීර්ඝ කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:13** ' දැන්වීම් පුවරුව සඳහා අදාළ ගාස්තුවෙන් නිදහස් කර ගැනීම සම්බන්ධවයි ' මැයෙන් කුලීගොඩ පුරාණ වනවාස රජමහා විහාරස්ථානය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

විමලධජ නාහිමි පදනම සංවිධානය කරන 'සම්බුද්ධ වන්දනා 2014' වෙසක් කලාපයේ පූර්ව ප්‍රචාරක දැන්වීම් පුවරුවක් අම්බලන්ගොඩ බස් නැවතුම්පොල ඉදිරිපිට 2014-02-22 සිට 2014-05-21 දක්වා මුදල් අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **'සම්බුද්ධ වන්දනා 2014' වෙසක් කලාපයේ පූර්ව ප්‍රචාරක දැන්වීම් පුවරුවක් අම්බලන්ගොඩ බස් නැවතුම්පොල ඉදිරිපිට 2014-02-22 සිට 2014-05-21 දක්වා මුදල් අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:14** ' 2014 වෙසක් උත්සවය නිමිත්තෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය සංවිධානය කරනු ලබන පුණ්‍ය කටයුතු සම්බන්ධවයි ' මැයෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමයේ ප්‍රධාන ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014 වර්ෂයේ වෙසක් උත්සවය නිමිතිකොට ගෙන මරණයට කැපවුන ගවයින් මරණින් මුදාගෙන ඇතිදැඩි කිරීමට සුදුස අයට භාරදීම, ගවමස් කෑමෙන් වැලකී සිටීම සඳහා පොරොන්දු අත්සන් කිරීම, ප්‍රදේශයේ ජනතාව ගවමස් කෑමෙන් වැලකී සිටීම පිළිබඳව දැනුවත් කිරීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සහ ගාලු පාර බෞද්ධ ධජ වලින් අලංකාර කිරීම යන කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් ඒ සඳහා අවශ්‍ය මුදල් සම්පාදනය කර ගැනීම සඳහා 2014 මැයි මස 01 වෙනිදා සිට 13 වන දින දක්වා බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණය ඉදිරිපස ඔරලෝසු කණුව අසල ප්‍රචාරාත්මක වැඩ සටහනක් පැවැත්වීම සඳහා අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **2014 මැයි මස 01 වෙනිදා සිට 13 වන දින දක්වා බස් නැවතුම් පොල වෙළඳ සංකීර්ණය ඉදිරිපස ඔරලෝසු කණුව අසල ප්‍රචාරාත්මක වැඩසටහනක් පැවැත්වීම සඳහා අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය වෙත සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:15** **‘** කාර්යාල පරීක්ෂණ වාර්තාව සඳහා පිළිතුරු **’** මැයෙන් අභ්‍යන්තර විගණන නිලධාරී මහත්මිය විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් යොමු කරන ලද විමර්ශන නිලධාරී මහතාගේ කාර්යාල පරීක්ෂණ වාර්තාව සඳහා පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
සභාවේ නිලධාරීන් විසින් අත්තිකාරම් මුදල් ලබා ගැනිමේදී ඒ සඳහා පළාත් පාලන කොමසාරිස් තුමාගේ අනුමැතිය ලබාගත යුතුයි කියල විමර්ශන නිලධාරී මහතා විසින් උපදෙස් දීල තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**
ගණකාධිකාරීතුමා සුළු මුදල් ලබා දෙන ප්‍රමාණය වැඩි කර ගැනිමට ඔබතුමා කටයුතු කරන්න. එතකොට අත්තිකාරම් කියන ප්‍රශ්නය එන්නෙ නැහැ. ඔබතුමා ගණන් තබන නිලධාරියා හමුවෙලා මේ වැඩේ කරගන්න.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
ගණකාධිකාරීතුමා ඔබතුමා අත්දැකීම් බහුල නිලධාරියෙක් විදියට මේ සම්බන්ධව ඉතා ඉක්මනින් ක්‍රියාත්මක වෙලා කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**
සභාපතිතුමනි නගර සභාවෙ මේවගේ පුංචි පුංචි දේවල් බාහිරයට යනකොට මේ දේවල් නිසා අපේ ප්‍රතිරූපය බිඳ වැටෙන්න පුලුවන්. ඒ නිසා මේ සම්බන්ධව වැඩි අවධානයෙන් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
ගණකාධිකාරීතුමා ලබන සභාව වෙනකොට මෙය නිවැරදි කරගන්න කටයුතු කරන්න.

**<u>තීරණය</u>**

☛ **අදාල නිලධාරීන් හමුවී නගර සභාවට ලබා දී ඇති සුළු මුදල් ප්‍රමාණය වැඩි කර ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට ගණකාධිකාරීතුමාට සභාවේ අනුමැතිය අනුමැතිය ලබා දෙන ලදී.**

**12:16** **‘** දෛනික දීමනාව වැඩිකර ගැනිම **’** මැයෙන් සෞඛ්‍ය අංශයේ රියදුරු මහතුන් පස් දෙනෙකු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාවේ සෞඛ්‍ය අංශයේ රියදුරන් වශයෙන් ඩී. පී. සුනිල් ශාන්ත, බී. පී. ලක්ෂමන්, ඩොනල්ඩ් ගාමිණී, එම්. කේ. ආර්. ඒෂාන් සහ එම්. ඩී. සුරේත් යන අය වසර දෙකක් පමණ සේවය කරන බවත් තමන්හට වැටුප් වැඩි වීමක් සිදු වීනොමැති අතර රියදුරු සේවයේ යෙදී සිටින තමන්හට රියදුරු ශ්‍රේණියේ වැටුප් තලයේ පිහිටුවීමට කටයුතු සලස්වන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>තීරණය</u>**

☛ **නගර සභාවේ සෞඛ්‍ය අංශයේ රියදුරන් ලෙස සේවය කරන ඉහත නම් සඳහන් සේවකයන්ගේ දෛනික වැටුප වැඩි කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:17** **‘** පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය වෙන්කරවා ගැනීම සඳහා **’** මැයෙන් පොල්වත්ත යුනයිටඩ් ක්‍රීඩා සමාජය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

පොල්වත්ත යුනයිටඩ් බක්මහ උළෙල 21 වන වරටත් පියසේන ළමා ක්‍රීඩාංගණයේදී අප්‍රේල් මස 18 සහ 19 යන දෙදින තුළ පැවැත්වෙන බවත් ඒ සඳහා එම දිනයන් දෙක සඳහා මුදල් අය කිරීමකින් තොරව ක්‍රීඩාංගණය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **අප්‍රේල් මස 18 සහ 19 යන දින දෙක යුනයිටඩ් බක්මහ උළෙල වෙනුවෙන් මුදල් අය කිරීමකින් තොරව පොල්වත්ත පියසේන ක්‍රීඩා පිටිය ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. ක්‍රීඩා පිටිය පෙර තිබූ තත්වයට පත් කර භාරදීමට යටත්ව ලබා දීමටද සභාව තීරණය කරන ලදී.**

**12:18** **‘** විනෝද බද්දෙන් නිදහස් කර ගැනීම **’** මැයෙන් ධර්මාශෝක විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංලමය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ධර්මාශෝක විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරනු ලබන “ ධවල භීෂණ ” වේදිකා නාට්‍ය මාර්තු මස 21 දින වේදිකා ගත වන බවත් එයින් ලැබෙන ආදායම විද්‍යාලයේ සංවර්ධනය සඳහා යොදා ගන්නා බවත් එනිසා මෙමගින් ලැබෙන ආදායම විනෝද බද්දෙන් නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ධර්මාශෝක විද්‍යාලයට ඉල්ලීම් කරන්න විතරක් නගර සභාව මතක් වෙනවා. මන්ත්‍රීවරුන්ගෙ දරුවන් පාසලට ඇතුලත් කරනකොට පැත්ත බලන්නෙ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මම ආදි ශිෂ්‍ය සංගමයේ සම ලේකම් වශයෙන් කියන්නෙ අපි ආදි ශිෂ්‍ය සංගමයේ අරමුදල් තර කර ගැනීමට තමයි මේ දේ කරන්නෙ. මම කියන්න කැමතියි දේශපාලන අධිකාරිය තියෙන්නෙ ඔබතුමන්ලගෙ අතේ. නගර සභාවෙ මන්ත්‍රීවරුන්ට කෝට එකක් ඉල්ල ගන්න. කලින් ඒ ක්‍රමේ තිබුණානෙ. මේ කටයුත්තෙදි මම ඉල්ලා සිටිනවා දරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් කරන කාර්යක් බැවින් මේ සඳහා සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නගරයේ තියෙන ජනප්‍රියම පාසල වශයෙන් විද්‍යාලය ඉල්ලපු කිසි දෙයක් මේ මන්ත්‍රීවරු පැහැර හැරල නෑ. සියලු දේ ලබා දීල තියෙනවා. නිති රාමු ඇති. මේ නගරය පාලනය කරන මහජන ජන්දෙන් පත්වෙලා ආව නියෝජිතයෙකුගේ ළමයෙක් අම්බලන්ගොඩ තියෙන ජනප්‍රිය පාසලට ඇතුලත් කර ගන්න බැරි වෙනවයි කියන්නෙ ඉතාම කණගාටුදායක සිද්ධියක්. අපි විද්‍යාලයේ පරිපාලනයට දොස් කියන්නෙ නැහැ. මන්ත්‍රීවරු ඉතාම අතලොස්සයි මේ නගරය පාලනය කරන්න පත් කරල තියෙන්නෙ. ඉතින් ඒ කෙනෙක්ගෙ දරුවෙක් නගරයේ ජනප්‍රිය පාසලකට දාගන්න බැරිවීම කණගාටුවට කරුණක්. අපි කවදාවත් විද්‍යාල වල ඉල්ලීම් පැහැර හැරල නැහැ. මන්ත්‍රීවරුන්ට තියෙන වේදනාකාරීත්වය මත තමයි මේ සභාවෙ මෙවැනි ප්‍රකාශ කෙරෙන්නෙ.

තීරණය

☛ **“ ධවල භීෂණ ” වේදිකා නාට්‍යයෙන් ලැබෙන ආදායම විද්‍යාලයේ සංවර්ධනය සඳහා යොදා ගන්නා බැවින් මෙමගින් ලැබෙන ආදායම විනෝද බද්දෙන් නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

✪ වෙනත් කරුණු

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි අපි මේ පාසල් වලට ළමුන් ඇතුලත් කිරීම සම්බන්ධව නොයෙක් අවස්ථාවල කතා කරා. ඒ දෙවල් අදාල ස්ථාන වලට දන්වල අපිට පිළිතුරක් එහෙම ඇවිල්ල තියෙනවද?

**ගරු සභාපති කමල් වැල්ගේ මහතා කතා කරමින්**

ඇත්තටම අපි විද්‍යාල වලටත් ගිහිල්ල කතා කරා. ඒවගේම අධ්‍යාපන අමාත්‍යාංශයට මේ ගැන දන්වා අරින්න මේ ගරු සභාව තීරණය කරා. ඒ සම්බන්ධව සිදුවී ඇති තත්වය පිළිබඳ සියලු විස්තර ලබන සභාවට මන්ත්‍රීවරුන්ට දැනගැනීමට දන්වා යැවීමට ලේකම්තුමාට දන්වා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් දි සිල්වා මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි මේ වසර ගණනාවෙම අපි මේ ගැන කතා කරා. ඒත් තාම කිසිම දෙයක් වෙලා නැහැ. ඒ නිසා අපි තීරණය කරපු බදාදා දිනයක මන්ත්‍රීවරු දොළොස්දෙනා එකතු වෙලා ලේකම්තුමා හම්බ වෙන්න යන්න. එදිනට අනිවාර්යෙන්ම හමුබවෙන්න පුලුවන්. අපි ලියුමක් දානව අහවල් දිනයේ අපි ඔබතුමාව හමුවෙන්න එනව කියලා.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ලේකම්තුමා මේ කාරණය මෙච්චර කල් කියලත් නිලධාරීන් තාම මේකට ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. ලේකම්තුමා මන්ත්‍රීවරු මෙතන කරණ යෝජනා නිලධාරීන්ගෙන් ක්‍රියාත්මක වෙන්න ඕනෙ අනිවාර්යෙන්ම. ලබන සභාව වෙනකොට නැහැයි බැහැයි කියන්න එපා මේ දේවල් ක්‍රියාත්මක වෙලා තියෙන්න ඕනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි මහ අම්බලන්ගොඩ බස් රථය සම්බන්ධව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට දැන්නුවද දන්නෑ.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ලේකම්තුමා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට දුරකථනයෙන් කතා කරල මේ කටයුත්ත ඉතා ඉක්මනින්ම කරන්න. කතා කරල වුන දේ ලියල තියන්න. ලබන සභාව වෙනකොට මේ දේ සම්බන්ධව තත්වය දැනුම් දෙන්න. මොකද මන්ත්‍රීතුමා මේ දේ ගැන අහන තුන්වෙනි වතාව මේ. ඒ නිසා හෙටම මේකට කතා කරල පිළිතුරක් ලබා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ පාරවල් වල සංවර්ධන කටයුතු නවත්තපු තැන ඉඳගෙන නැවත කරන්න කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අපේ ඉන්න සේවකයොත් එක්ක තමයි මේ ප්‍රශ්නෙ තියෙන්නෙ. අපි සෘජු ශ්‍රමික පදනම යටතේ කණ්ඩායමක් බඳවගෙන ඉතා ඉක්මනින් මේ මාර්ග නඩත්තු කිරීම් සිදු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි කරිත්තකන්ද ග්‍රාම නිලධාරී වසමේ ප්‍රජා කම්ටුවේ ලේකම්තුමා ලිපියක් එවල තියෙනවා. මෙහි සඳහන් ක්ෂණිකව කරන්න පුලුවන් ඒව ක්ෂණිකවත්  ඇස්තමේන්තු සකස් කරල කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි වැඩ අධිකාරී මහතා සකස් කරපු ලැයිස්තුවේ කෙරම්ණිය පින්නදූව මාර්ග කිහිපයක් තිබුන. ඒවගේම පතිරාජ පටුමගේ බෑවුම සහ පින්නදූව සෝමතුංග මහතාගේ කඩය අසල මෙම ස්ථාන දෙක පිළිසකර කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

පොඩි ප්‍රශ්නයක් තියෙන්නෙ වැඩට එන සේවකයන් සම්බන්ධයෙන්. මම ලේකම්තුමාට උපදෙස් දෙනවා මින් පසුව මෙම සේවකයන් නිවාඩු ගන්නවනම් ඊට කලින් දින නිවාඩු අනුමත කර ගන්න කියලා. නැත්තම් මේ ආයතනය කරගෙන යන්න හම්බ වෙන්නෙ නැහැ. මේ අයගෙ නිවාඩු සම්බන්ධයෙන් ඔබතුමාල කටයුතු කරන්නෙ නැත්තෙ ඇයි? සෞඛ්‍ය අංශයේ මේක හරියට කෙරෙනවා. කර්මාන්ත අංශෙ මේක නැහැ. ඒ නිසා හැම දෙනාටම එක විදියට නීතිය කරන්න. නැත්තම් මේ ආයතනය ගෙනියන්න බැරි වෙනවා. මම පෞද්ගලිකව කතා කරල සේවකයන් කණ්ඩායමක් කතා කර ගත්තා. මම හිතනවා ඒ අ ය එක්ක වැඩ කරල මේ මාර්ගවල  තියෙන අඩුපාඩු ටික හදාගන්න පුලුවන් වේවි කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. භාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය කතා කරමින්</u>**

සභාපතිතුමනි ලීඩ්ස් විදුහල ඉදිරිපිට පාසල් දරුවන්ට පාර පැනීමට කහ ඉරක් නැහැ.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඒක මාර්ග සංවර්ධන අධිකාරියට දන්වල කරන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. හාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය කතා කරමින්**

සභාපතිතුමනි බන්දු විජේසූරිය කලායතනය ඉදිරිපිට කුණු දාන භාජනය අයින් කරා. දැන් එතන ගල් කෑලි වගේ තියෙනවා. එතන පස් ට්‍රැක්ටරයක් වගේ දාල ටිකක් පිළිවෙලට සකස් කරල දෙන්න.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඒක අයින් කරාට විරුද්ධවත් ලියුමක් ඇවිල්ල තියෙනවා. ඒත් අපි ඒ තිරණේ ගත්තෙ සෞඛ්‍ය කමිටුවෙන්.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ සභාවෙ අපි කිහිප වතාවක්ම කතා කරා ස්වභාවික පිහිනුම් තටාකය පිළිබඳව. අද වෙනකොට මෙතන හොඳටම වැලි පිරිල. මේ කාලෙ තමයි එතන වැලි අයින් කරන්න හොඳම කාලය. පොඩි බැම්මක් දාන්න විතරයි තියෙන්නෙ මෙහා පැත්තෙන්.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපිට වෙරළ සංරක්ෂණයෙන් අවසර ගන්න වෙයි. අපිට මේක බැකෝ එකක් මගින් අස් කරන්න බැරිද?. JCB යන්ත්‍රයක් මගින් මේක ඉක්මනින්ම අයින් කරන්න. බැම්ම බඳින එකට ඇස්තමේන්තුවක් හදන්න. මන්ත්‍රීවරු සියලු දෙනාම කැමතියි. අපි අනුමත කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මෙතන වෙරළ සංරක්ෂණයට අයිතියි. බැම්ම දැම්මට එහෙන් උපදෙස් ගන්න වෙනවා. ඔබතුමා පුද්ගලිකව කතා කරල වැලි අයින් කරන එක කරගන්න බලන්න.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මම ඒක කතා කරන්නම්. වැඩ අධිකාරීතුමා මැෂින් එක ලෑස්ති කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේකෙ ප්‍රධානම කාරණය තමයි පිට අය තාමත් අම්බලන්ගොඩට එනව මේක නිසා. ඒඅ ය වියදම් කරගෙන ඇවිල්ල අපරාධයක් වෙනවා. මට කොළඹින් කීප දෙනෙක් කතා කරල කිව්ව.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපි ඒක ඉතා ඉක්මනින් කරන්නම්.

**ප. ව. 01.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

භාරත සමරසේකර,
ලේකම් ,
අම්බලන්ගොඩ නගර සභාව.

වැල්ලගේ කමල් ද සිල්වා,
සභාපති (වැ. බ.),
අම්බලන්ගොඩ නගර සභාව.

**2014 – 03 – 25 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**